# අග්ගික භාරද්වාජ සූත්‍රය

(වසල ධර්ම සිව්තිස)

සම්පාදක:-

**පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි.**

**(ධර්ම දානය පිණිසයි.)**

# හැඳින්වීම

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

**"ද්වෙ'මානි භික්ඛවෙ දානානි, ආමිසදානඤ්ච, ධම්මදානඤ්ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං ධම්මදාන'න්ති".**

(ඛු: නි: ඉති: ති: නි: දාන සූත්‍රය)

මහණෙනි! මේ දාන දෙකකි. ආමිස දානය හා ධර්‍ම දානයයි. මහණෙනි මේ දාන දෙක අතරින් මේ ධර්‍ම දානය අග්‍ර වන්නේ ය.

දිය යුත්ත **දානය** නම් වේ. එයින් චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලන්පස බෙහෙත් පරිෂ්කාරාදිය දන් දීම **ආමිස දානය** නම් වේ. ඒවා තණ්හා දිට්ඨි ආදියෙන් ස්පර්‍ශ කළ යුතු බැවින් **ආමිසයයි** කියනු ලැබේ.

ඒ ආමිස චේතනාවෙන් පරිත්‍යාග කළ යුතු බැවින් **ආමිස දානය** නම් වේ. මේ ආමිස වනාහි සියලු දානයන්ගේ නිදානය හෙවත් මූල හේතුවයි. සියලු සම්පත්තීන්ගේ මූලයයි.

මෙලොව යමෙක් මේ කුසල ධර්‍මය, මේ අකුසල ධර්‍මය, මේ වැරදි ධර්‍මය ය, මේ නිවැරදි ධර්‍මය ය, මේ නුවණැත්තන් විසින් ගැරහිය යුතු ධර්‍මය, මේ නුවණැත්තන් විසින් පැසසිය යුතු ධර්‍මය, මේ ධර්‍මය අහිත පිණිස දුක් පිණිස පවතී. මේ ධර්‍මය හිත සුව පිණිස පවතී, යනුවෙන් ත්‍රිවිධ ද්වාරයෙන් සිදු කරන කුසල-අකුසල වශයෙන්, කර්‍ම - කර්‍ම පථ වශයෙන් බෙදමින්, කර්‍මය - කර්‍ම විපාකය වශයෙන් බෙදමින් මෙලොව පරලොව ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දක්වන්නාක් මෙන් ප්‍රකට කරමින් අකුසල ධර්‍මවලින් වළක්වමින් කුසල ධර්‍මයන්හි පිහිටුවමින් ධර්‍ම දේශනා කිරීම, දහම් පොත් ලියා බෙදා දීමාදීය **ධර්‍ම දානය** නම් වේ.

යමෙක් මේ ධර්‍ම අනිත්‍යාදී විශිෂ්ටාකාරයෙන් දත යුතු ධර්‍මයෝ ය, මේ ධර්‍ම අනිත්‍යාදී වශයෙන් දත යුතු දුක්ඛ ධර්‍මයෝ ය, මේ ධර්‍ම දුරු කළ යුතු ය, මේ ධර්‍ම වැඩිය යුතු ය, මේ ධර්‍ම ප්‍රත්‍යක්‍ෂ කළ යුතුය යැයි චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකට කරමින් නිර්‍වාණාවබෝධය පිණිස ප්‍රතිපත්ති මාර්‍ගය දෙශනා කරයි ද, දහම් පොත් ලියා ධර්‍මදාන වශයෙන් බෙදා දෙයි ද මෙය උසස් ම ධර්‍ම දානය, අග්‍ර ම ධර්‍ම දානය වේ. මේ නිවන පිණිස හේතුවන ධර්‍මදානය හේතුවෙන් සියලු අනර්‍ථයන්ගෙන් මිදෙයි. සියලු සසර දුක් ඉක්මවයි.

මෙසේ අග්‍ර ආනිශංස ගෙන දෙන ධර්ම දානමය කුසලයක් සිදුකර ගැනීමේ අදහසින් යුතුව ඛුද්දක නිකායෙහි ඇතුළත් වන අනර්ඝ සූත්‍ර දේශනාවක් වන අග්ගික භාරද්වාජ සූත්‍රය පරිපූර්ණ වූ අර්ථ විවරණයන්ගෙන් යුක්තව මෙයින් ඉදිරිපත් කරමි. මෙලොව දීම ගර්හාවට, ව්‍යසනයන්ට හේතුවන පරලොව දී අපායාදී බොහෝ දුක්ඛයන්ට හේතුවන නිවන් මඟ වරදවන අකුසල ධර්ම තිස්හතරක් **වසල ධර්ම** නමින් මෙම සූත්‍රයෙන් ඉදිරිපත් වේ.

මෙසේ වූ මහඟු කුසලයක් සිදුකර ගැනීමට මූල හේතුව වූයේ 2014 - 04 - 24 වන දිනට දිවියේ හැත්තෑ සත් වසරක් සපිරෙන සම්බුදු සසුනෙහි වැඩිය යුතු පිරිය යුතු උසස් ගුණයන්ගෙන් සපිරි ගුණ නිධානයක් වූ ගුරු දේවෝත්තම අති පූජනීය මහා කර්මස්ථානාචාර්ය නා උයනේ මහා ස්වාමින් වහන්සේට ගුරු බැතියෙන් කරන පූජෝපහාරයක් වශයෙනි. මේ ධර්ම දානමය කුසල බලයෙන් ද, රත්නත්‍රයේ අසීමිත ගුණානුභාව බලයෙන් අති පූජනීය නා උයනේ මහා ස්වාමින් වහන්සේට නිදුක් නිරෝගී සුවයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් මුළුල්ලෙහි ශාසනානුග්‍රහය දක්වමින් උසස් ගුණ පුරා ලොවුතුරා බුදු බව සුවසේ ලබත්වා යි විශේෂයෙන් ආශීර්වාද කරමි. එසේම අති පූජනීය මීගොඩ ස්වාමින් වහන්සේ, අඟුල්ගමුවේ ස්වාමින් වහන්සේ ප්‍රධාන ප්‍රතිපත්තිකාමී මහ සඟරුවනට ද ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම වාසී වූ ද, ලක් වැසි වූ ද, ලෝ වැසි වූ ද සියලු මහ සඟරුවනට ද ශාසනානුග්‍රහය දක්වමින් උසස් ගුණ පුරා නිවන් සුව සුවසේ ලබත්වා යි ආශීර්වාද ප්‍රාර්ථනා කරමි. එසේම මව්පිය ඥාත්‍යාදී සැමට ද, සදේවක ලෝක වාසීන්ට ද නිවන් සුව සුවසේ ලබන්නට හේතු වේවා යි ප්‍රාර්ථනා කරමි.

මෙයට මෙතැති,
නිකපිටියේ ගුණරතන හිමි.
2014 - 04 - 24

# පටුන

හැඳින්වීම.....3

අග්ගික භාරද්වාජ සූත්‍රය.....7

❄ අග්ගික භාරද්වාජ සූත්‍රය.....11

❄ සූත්‍ර නිදානය.....11

❄ ප්‍රථම ධර්ම සංගායනාව.....12

☸ ආනන්ද තෙරුන් රහත් වීම.....19

☸ විනය සංගායනා කිරීම.....20

☸ ධර්මය සංගායනා කිරීම.....21

☸ ධර්ම විනය බෙද දැක්වීම.....23

❄ අග්ගික භාරද්වාජ සූත්‍ර සංගායනාව.....27

☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම.....28

☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම.....29

☸ ප්‍රතික්ෂේප සතර.....30

☸ ආයාචනා සතර.....31

❄ නිදාන වර්ණනාව.....33

☸ පෙර බත් කිස.....38

☸ පසුබත් කිස.....40

☸ පෙරයම් කිස.....41

☸ මැදියම් කිස.....41

☸ පැසුළුයම් කිස.....42

❄ වසල කරන ධර්ම.....46

☸ ලෝකෝත්තර සරණගමනය.....76

☸ ලෞකික සරණගමනය.....76

✿ අත්තසන්නීයාතන සරණාගමනය.....77

- ✿ **තත්පරායන සරණාගමනය** ....................77
- ✿ **ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය** ....................77
- ✿ **පණිපාත සරණාගමනය** ....................77

❄ **උපාසකත්වය** ....................80

# අග්ගික භාරද්වාජ සූත්‍රය

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. තෙන බො පන සමයෙන අග්ගික භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා. අථ බො භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො යෙන අග්ගික භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි.

අද්දසා බො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච "තත්‍රෙව, මුණ්ඩක, තත්‍රෙව, සමණක, තත්‍රෙව, වසලක තිට්ඨාහී"ති.

එවං වුත්තෙ, භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච"ජානාසි පන ත්වං, බ්‍රාහ්මණ, වසලං වා වසලකරණෙ වා ධම්මෙ"ති? නඛ්වාහං, භො ගොතම, ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ, සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථාහං ජානෙය්‍යං වසලං වා වසලකරණෙ වා ධම්මෙ"ති. "තෙන හි, බ්‍රාහ්මණ, සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමී"ති. "එවං, භො"ති බො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච.

කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨි මායාවී - තං ජඤ්ඤා වසලො ඉති.

එකජං වා ද්විජං වාපි - යොධ පාණං විහිංසති,
යස්ස පාණෙ දයා නත්ථි - තං ජඤ්ඤා වසලො ඉති.

යො හන්ති පරිරුන්ධති - ගාමානි නිගමානි ච,
නිග්ගාහකො සමඤ්ඤාතො - තං ජඤ්ඤා වසලො ඉති.

ගාමෙ වා යදි වා රඤ්ඤෙ - යං පරෙසං මමායිතං,
ථෙය්‍යා අදින්නං ආදියති - තං ජඤ්ඤා වසලො ඉති.

යො හවෙ ඉණමාදය - චුජ්ජමානො පලායති,
න හි තෙ ඉණමත්ථීති - තං ජඤ්ඤා වසලො ඉති.

යො වෙ කිඤ්චික්ඛකම්‍යතා - පන්ථස්මිං වජන්තං ජනං,
හන්ත්වා කිඤ්චික්ඛමාදෙති - තං ජඤ්ඤා වසලො ඉති.

අත්තහෙතු පරහෙතු - ධනහෙතු ච යො නරො,
සක්ඛිපුට්ඨො මුසා බෲති - තං ජඤ්ඤා වසලො ඉති.

යො ඤාතීනං සඛීනං වා - දරෙසු පටිදිස්සති,
සහසා සම්පියෙන වා - තං ජඤ්ඤා වසලො ඉති.

යො මාතරං පිතරං වා - ජිණ්ණකං ගතයොබ්බනං,
පහු සන්තො න භරති - තං ජඤ්ඤා වසලො ඉති.

යො මාතරං පිතරං වා - භාතරං භගිනිං සසුං,
හන්ති රොසෙති වාචාය - තං ජඤ්ඤා වසලො ඉති.

යො අත්ථං පුච්ඡිතො සන්තො - අනත්ථමනුසාසති,
පටිච්ඡන්නෙන මන්තෙති - තං ජඤ්ඤා වසලො ඉති.

යො කත්වා පාපකං කම්මං - මා මං ජඤ්ඤාති ඉච්ඡති,
යො පටිච්ඡන්නකම්මන්තො - තං ජඤ්ඤා වසලො ඉති.

යො වෙ පරකුලං ගන්ත්වා - භුත්වාන සුචිභොජනං,
ආගතං න පටිපූජෙති - තං ජඤ්ඤා වසලො ඉති.

යො බ්‍රාහ්මණං සමණං වා - අඤ්ඤං වාපි වනිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති - තං ජඤ්ඤා වසලො ඉති.

යො බ්‍රාහ්මණං සමණං වා - භත්තකාලෙ උපට්ඨිතෙ,
රොසෙති වාචා න ච දෙති - තං ජඤ්ඤා වසලො ඉති.

අසතං යොධ පබ්‍රෑති - මොහෙන පළිගුණ්ඨිතො,
කිඤ්චික්ඛං නිජිගිංසානො - තං ජඤ්ඤා වසලො ඉති.

යො චත්තානං සමුක්කංසෙ - පරඤ්ච මවජානාති,
නිහීනො සෙන මානෙන - තං ජඤ්ඤා වසලො ඉති.

රොසකො කදරියො ච - පාපිච්ඡො මච්ඡරී සඨො,
අහිරිකො අනොත්තාපි - තං ජඤ්ඤා වසලො ඉති.

යො බුද්ධං පරිභාසති - අථ වා තස්ස සාවකං,
පරිබ්බාජං ගහට්ඨං වා - තං ජඤ්ඤා වසලො ඉති.

යො වෙ අනරහා සන්තො - අරහං පටිජානති,
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ - එසො ඛො වසලාධමො,
එතෙ ඛො වසලා වුත්තා - මයා යෙතෙ පකාසිතා.

න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති - කම්මුනා හොති බ්‍රාහ්මණො.

තදමිනාපි විජානාථ - යථාමෙදං නිදස්සනං,
චණ්ඩාලපුත්තො සොපාකො - මාතඞ්ගො ඉති විස්සුතො.

සො යසං පරමං පත්තො - මාතඞ්ගො යං සුදුල්ලභං,
ආගච්ඡුං තස්සුපට්ඨානං - ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

දෙවයානමාරුය්හ - විරජං සො මහාපථං,
කාමරාගං විරාජෙත්වා - බ්‍රහ්මලොකූපගො අහු.

න නං ජාති නිවාරෙසි - බ්‍රහ්මලොකූපපත්තියා,
අජ්ඣායකකුලෙ ජාතා - බ්‍රාහ්මණා මන්තබන්ධවා.

**තෙ ච පාපෙසු කම්මෙසු - අභිණ්හමුපදිස්සරෙ,**
**දිට්ඨෙව ධම්මෙ ගාරය්හා - සම්පරායෙ ච දුග්ගතිං,**
**න නං ජාති නිවාරෙති - දුග්ගච්චා ගරහාය වා.**

**න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො,**
**කම්මුනා වසලො හොති - කම්මුනා හොති බ්‍රාහ්මණො"ති.**

**එවං වුත්තෙ, අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච "අභික්කන්තං, භො ගොතම, අභික්කන්තං, භො ගොතම! සෙය්‍යථාපි, භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත'න්ති.**

# ❄ අග්ගික භාරද්වාජ සූත්‍රය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර **අනාථපිණ්ඩික** මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද **ජේතවනාරාමයෙහි** වැඩසිටි දිනක මෙම අග්ගික භාරද්වාජ හෙවත් වසල සූත්‍රය **අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තුමා** අරභයා දේශනා කොට වදාළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේ ය.

## ❄ සූත්‍ර නිදානය

**"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ."**

**"මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජෙතවනය නම් වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමයෙහි වැඩ වසන සේක."**

බුද්ධූපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විමසූ කල්හි පන්සියයක් මහරහතන් වහන්සේලා හමුවෙහි මෙම සූත්‍රය සංගායනාවට භාජනය කළේ ය. මෙය ඛුද්දක නිකායේ සුත්ත නිපාතයේ උරග වර්ගයෙහි එන සත් වන සූත්‍ර දේශනාවයි.

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වනාහි සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම අවබෝධ කළ සේක. ආචාර්යවරයෙකු නොමැත්තේ ය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා හික්මවීම දක්වා වූ පන්සාලිස් වස තුළ කළ

යුතු සියලු බුද්ධ කෘත්‍යයන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැඟිටිනා සෙය්‍යාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසලොස්වක පොහෝය දින අලුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

## ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්ෂයක් භික්ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත් වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්ෂ මූලයක වැඩසිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදරා මලක් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් "**කොහි සිට එන්නේ ද**" යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. "**අපගේ ශාස්තෘන් වහන්සේ දන්නෙහි ද**" යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන බව කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදගාමී ආර්යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේ ය. එම භික්ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවෑමියෙකු ව සිට වයස්ගත ව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම ගෙවත්තෙහි ම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන් වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්ෂු පිරිසක්

පිරිවරාගෙන කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේ ය යැයි අසා සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා **"දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස් රැවුල් කපා ලුණු තෙල් හා අනුභව කළ යුතු දේ රැස් කරව්. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු"** යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේ ද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් භොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සැදවූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් එල රස ආදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවී ය. තව ද හකුරු යොදා කරන ලද **"මධුගෝළක"** නම් කැවිලි ද පිළියෙල කරවූයේය. මෙයට **"අතිරස කැවුම්"** යැයි ද, **"මධුසීසක"** යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු **"භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කවුරුන් හට කැඳ පිළිගන්වන්නෙහි ද"** යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා"** යැයි ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේ ද"** යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනය ද, **"පූර්වයෙහි භාවිතා කළ කරණවෑම් බඩු පාවිච්චි නොකළ යුතුය"** යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දැහැමි කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදළ සේක. **"මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීර්ඝ සංසාරයේ කල් ගත කරන ලදී. මෙය වනාහි නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහි ම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළි නො ගන්න"** යැයි වදරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නො ගත්හ. සුභද්‍ර භික්ෂුව නො සතුටු ව **"මොහු සියල්ල දනිම් යි ඇවිදියි. ඉදින් නො ගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේ ද, මා වෙහෙසීමෙන් කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේ ය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේ ය"** යැයි තථාගතයන් වහන්සේ සමග වෛරී ව සිට තථාගතයන් වහන්සේ ජීවමාන ව සිටියදී කිසිවක් කියන්නට

නොහැකි ව සිට පිරිනිවියේ යැයි අසා සතුටු ව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේ ය.

**"ඇවැත්නි, ශෝක නොකරව්. නො වැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැපය, මෙය නුඹලාට අකැප ය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත් කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැට වලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මේ වචනය කීවේ ය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේ ය. තෙරුන් වහන්සේ සිතන සේක් **"සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අද ද ඒ බුදු සිරුර රන් පැහැයම ය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුකසේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේ ය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේ ය. ඉදින් වනාහි මම මේ මහල්ලා ව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබිය දී ම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දෙස් පවරන්නාහුය"** යැයි සිතා නැවත ද මෙසේ සිහිපත් කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදී. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පවිටු පුද්ගලයන් නිසා කල් ගතවන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේ ය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේ ය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වාරයන් නැසී යන්නේ ය. මෙසේ පිළිවෙලින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්ම - විනය දෙක ස්ථිරව පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ම මට පෙර ගමන්

කළ සේක. අවවාද තුනකින් උපසම්පදව දුන් සේක. කයින් සිවුරු මාරු කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්ව විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්ම - විනය සංගායනාව හැර අන් කිනම් මගකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජ කෙනෙකු තමන්ගේ සන්නාහයත් ඓශ්වර්යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ **"මෙතෙම මාගේ සද්ධර්ම වංශය පිහිටුවන්නෙකු වන්නේ ය"** යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක යැයි සිතුවේ ය. එසේම **"මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නො තැබිය යුතු ය. යම්තාක් අධර්මය අවිනය නො බැබළේ ද ඒ තාක් ධර්මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්මය අවිනය බැබළේ ද එවිට ධර්මයත් විනයත් පසු බසින්නේ ය. එබැවින් අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්ම - විනය දෙක සංගායනා කරන්නේ නම් මැනවි"** යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදහනය වූයේ ය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහි ම පැවතුණේ ය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත් වන දින ආදහනය සිදු විය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා **ඇවැත්නි, මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන් හඬා වැලපෙන කල්හි එක් පාපී භික්ෂුවක් "ඇවැත්නි නො හඬන්න නො වැලපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මෙසේ කීවේ ය.

පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන් ගේ නැඟී සිටීම විය. ධර්මය ශාස්තෲන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි ද, ධර්මය ශාස්තෲවරයෙකු නැති එකක් ය යැයි ද සිතන පාපී භික්ෂූහු අලජ්ජී පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින් ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහු ය යන මේ කාරණයක් වේ ද, මෙය විද්‍යමාන වන්නේ ය. යම්තාක් ධර්මය විනය පවත්නේ ද, ඒ තාක් බුද්ධ වචනය නො ඉක්මවා සිටින ශාස්තෲවරයෙකු ඇති එකක් වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ම "**යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා**" යනුවෙන් "**ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්ම - විනය දෙක මාගේ පරිනිර්වාණයෙන් පසු නුඹලාට ශාස්තෲ වන්නේ ය**" යැයි මේ කාරණය වදරන ලද්දේ ම ය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේ ම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා**" යි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෲ ශාසන සංඛ්‍යාත පර්යාප්ති ධර, නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදාගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්යාප්ති ප්‍රභේදයන්හි පර ප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින් ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා ආදී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලා ම හාරසිය නව අනූ නමක් (499) තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යත්? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහා ය. ඒ වන විට ආනන්ද තෙරණුවෝ රහත් ව නො සිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්ම - විනය කාරණා උගත්තේ ය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්ම සංගායනාව නොකළ හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන් ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවිර භික්ෂූන්

වහන්සේලාට "**අපි ධර්‍ම, විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමු ද**" යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

"**රජගහ නුවර භික්ෂාව ලැබීමට පහසු ය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමා ගේ දැහැමි ආරක්ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්‍මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙකු සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්ෂූහු රජගහ නුවර වස් නො විසිය යුතුය. ධර්‍ම සංග්‍රාහක තෙරුන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය**" යැයි අදහස වී ඤත්ති දුතිය කර්‍මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ලංවන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත කරගත් රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහ නුවර වඩිනු කැමති ව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්ෂු පිරිසක් පිරිවරා සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්‍වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහි ම වැඩසිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුළත් "**සුභ සූත්‍රය**" වදාළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ලං වන බැවින් උපකාරක එක් භික්ෂුවක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහි රජගහ නුවර මහා විහාර අටලොසක් (18) වූහ. ඒවා අතර **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ වනය, මෝර නිවාපය, ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර ප්‍රපාතය,** ඉසිගිලි පර්වතය පාමුල වූ **කාලසිලාව,** වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණී ගුහාව, සීත** වන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බභාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, ඉන්ද සාල ගුහාව, පිප්ඵලි ගුහාව,** ගිජ්ජකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අතහැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩු වලින් ගැවසී පාලු විය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක **"භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරන්නෙමු"** යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ **"ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෲන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අත හැරියාහු වෙති"** යැයි මෙසේ කියන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදී. ඇවැත්නි, එබැවින් අපි වස්කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම - විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේ ය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද **"මහ රජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු"** යැයි කීහ. රජතුමා එය අසා **"ස්වාමීනි, විශ්වාස ඇත්තෝ ව කරනු මැනවි. ස්වාමින් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද"** යැයි අසා සිටියේ ය. **"මහ රජ, ධර්මය - විනය සංගායනා කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය"** යැයි කීහ. **"එය කොතැන්හි කළ යුතු ද"** යැයි රජතුමා

ඇසුවේ ය. "**වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණි ගුහා ද්වාරයෙහි සුදුසු ය**" යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමාන ව, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පියගැටපෙළ ඇති, නන් වැදෑරුම් මල් කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්ලන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පස තුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත් දළවලින් ලියවන ලද විසිතුරු විජිනිපතක් තබා "**ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදී**" යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේ ය.

## ☸ ආනන්ද තෙරුන් රහත් වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්‍ෂව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ "**ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේ ය. නුඹ තවම ශෛක්‍ෂයෙකි, රැස්වීමට යෑමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය**" යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද "**හෙට රැස්වීම වන්නේ ය. මා විසින් ශෛක්‍ෂව රැස්වීමට යෑම නොවටීය**" යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් "**කායගතා සති**" කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අලුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝද විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිඳුණාහ. හිස කොට්ටයට නො පැමිණියේ ය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම, සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ. එබැවින් **මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන්**

**වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේ ය** යැයි කිව යුතු වන්නේ ය.

පසු දින ස්ථවිර භික්ෂූන් වහන්සේලා බත් කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩ හුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත් ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නො වැඩියේ ය. භික්ෂූන් වහන්සේලා "**මේ ආසනය කවරෙකු සඳහා ද**" යැයි විචාළහ. "**මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා**" යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතු ව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩසිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත් ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලා ම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ "**ඇවැත්නි, ධර්මය විනය දෙකෙන් කවරක් පළමු ව සංගායනා කරන්නෙමු ද**" යැයි භික්ෂු සංඝයා ඇමතු සේක. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ ශාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමු ව විනය සංගායනා කරමු**" යැයි කීහ. "**කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතු ද**" යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේ ය. "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය

විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ, සඞෙඝා. යදි සඞසසස පත්තකල්ලං, අහං ආයසමතා මහාකසසපෙන විනයං පුටෙඨා විසසජෙජයයං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැට වටු ගන්වා ගෙන, වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩ හුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාල සේක.

"**ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවර දී පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. "**කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කුමන වස්තුවෙහි පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. "**මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. ඉන් පසු සියලු දෙනා වහන්සේ ම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදන සහිතව සන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු ශික්ෂා පදයන් ද, භික්ෂු භික්ෂුණී උභතෝ විභංගය ද, දෙවිසි ඛන්ධකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩ හුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්ෂු සංඝයා වහන්සේ අමතා "**ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද**" යැයි අසා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙන ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහි ය. එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්මය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞෙඝා. යදි සඞසසස පත්තකල්ලං,**

**අහං ආයසමන්තං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්මය විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැගිට සිවුර ගැටවටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්මය විචාල සේක.

"**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා ද බ්‍රහ්මදත්ත මානවකයා ද අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු "**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. "**කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**වේදේහිපුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කරන ලද්දේ වූ ධර්ම - විනය විවිධාකාරයෙන් බෙද දැක්වූහ.

## ☸ ධර්‍ම විනය බෙද දැක්වීම

මේ සියලු බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වේ. ධර්‍මය - විනය වශයෙන් දෙ වැදෑරුම් වේ. වචන වශයෙන් තෙවැදෑරුම් වේ. පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්‍මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් (84,000) වේ.

### ✠ බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජල බිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්ත ය.

### ✠ ධර්‍ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?

කාය - වාක් සංවරය පිණිස පනවා වදළ සියලු බුද්ධ වචනය "විනය" නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදළ අවශේෂ බුද්ධ වචනය "ධර්‍ම" නම් වේ.

### ✠ වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්‍මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරලී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

"අනෙක ජාති සංසාරං - සන්‍ධාවිස්සං අනිබ්බිසං,<br>
ගහකාරකං ගවෙසන්‍තො - දුක්‍ඛා ජාති පුනප්පුනං"

**"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,**
**විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.**

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදාළ **"හන්දදානි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ"** යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

### ✠ පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නො නැගුණා වූ ද සියල්ල එක් කොට **"උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙව්සි කඳුවත්, සෝළස පරිවාර"** යන මේ සියල්ල **"විනය පිටකය"** නම් වේ. **"දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය"** යන මේ සියල්ල **"සූත්‍ර පිටකය"** නම් වේ. **"ධම්මසංගණී, විභංග, ධාතු කථා, පුග්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන"** යන ප්‍රකරණ සත **"අභිධර්ම පිටකය"** නම් වේ.

### ✠ නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි පටන් දීඝ වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය **"දීඝනිකාය"** නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය **"මජ්ඣිම නිකාය"** නම් වේ. ඔඝතරණ සූත්‍රයෙහි පටන් සත් දහස් සත් සිය දෙසැටක් (7762) සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය **"සංයුත්ත නිකාය"** නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත් පනසකින් (9557) යුත් වර්ග එකසිය සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත් සංග්‍රහය **"අංගුත්තර නිකාය"** නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුළත් නොවූ **"ඛුද්දක පාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක,**

**සුත්තනිපාත, විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරිගාථා, පටිසම්භිද, අපදාන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක**" යන කුඩා ග්‍රන්ථ පසළොස ද, "**විනය පිටකය හා අභිධර්ම පිටකය**" යන දෙක ද ඇතුළත් ව මේ සියල්ල "**ඛුද්දක නිකාය**" නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

✠ **අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,**

"**සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල**" යන මේ නවයයි. මෙය "**නවාංග ශාස්තෘ ශාසනය**" නම් වේ.

- "**උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර**" යන මේවා ද, සුත්ත නිපාතයෙහි ඇතුළත් "**මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය**" ආදී සූත්‍ර නාමයෙන් දක්වෙන සියලු බුද්ධ වචනය "**සුත්ත**" නම් වේ.
- සියලු ගාථා සහිත සූත්‍ර "**ගෙය්‍ය**" නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.
- සියලු අභිධර්ම පිටකය ද, සියලු නිගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද "**වෙය්‍යාකරණ**" නම් වේ.
- "**ධම්මපද, ථෙර ගාථා, ථෙරි ගාථා**" යන මේවා ද, සුත්ත නිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නො ගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද "**ගාථා**" නම් වේ.
- සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත අසූදෙකක් සූත්‍ර "**උදාන**" නම් වේ.
- "**වුත්තඤ්හෙතං භගවතා**" ආදී ලෙස නැවත දේශනා කරන ලද එක සිය දෙළොසක් සූත්‍ර "**ඉතිවුත්තක**" නම් වේ.

- අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හි ම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්ව බෝධිසත්ව චර්‍යාවන් "**ජාතක**" නම් වේ.
- "**චත්තාරොමෙ, භික්ඛවෙ, අච්ඡරියා අබ්භූතා ධම්මා ආනන්දෙ**" යනාදී ලෙස පැවති සියලු ම ආශ්චර්‍ය අද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා "**අබ්භූතධම්ම**" නම් වේ.
- "**චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මා දිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාර භාජනීය සූත්‍රය, මහා පුණ්ණම සූත්‍රය**" ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර "**වෙදල්ල**" නම් වේ.

**✠ ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් වන්නේ කෙසේ ද?,**

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරණ ලද්දේ ය.

"**ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො**"

"**මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙඅසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි**" යැයි වදළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් "**කති ඡින්දෙ කති ජහෙ**" යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ "**පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ**" යනාදී ලෙස වදාළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි එක දුක මාතිකා, තික මාතිකාවන් බෙදීම ද, එක චිත්තවාර බෙදීම ද, එක ධර්මස්කන්ධ වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පද භාජනීය ඇත,

අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තික පරිච්ඡේද ඇත. එහි එක කොට්ඨාශ එක එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසකි (84,000).

## ❈ අග්ගික භාරද්වාජ සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩසිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අසන සේක් "**ආනන්දය, තථාගතයන් වහන්සේ මෙම අග්ගික භාරද්වාජ සූත්‍රය කොතැනකදි දේශනා කළ සේක් ද?**" ධර්මාසනයෙහි වැඩ සිටියා වූ ආනන්ද මහරහතන් වහන්සේ එය විසඳන සේක් "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, සැවැත් නුවර ජේතවනය නම් වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමයෙහි  දී දේශනා කොට වදාළ සේක**" යැයි කීවේ ය. මහා කාශ්‍යප රහතන් වහන්සේ "**ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක් ද**" යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තුමා අරභයා වදාළ සේක**" යැයි කීවේ ය. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ "**කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක් ද**" යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, එම බ්‍රාහ්මණ තුමාට තෙරුවන් සරණ යෑමට ඇති හේතු සම්පත් දැක දේශනා කොට වදාළ සේක**" යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වේනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගත් බව දැක්වීමට මෙසේ ඉදිරිපත් කළේ ය. එහි පිළිවෙළ කථාව මෙසේ ය.

## ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවී ය. ඒ කාලපරිච්ඡේදයෙහි දී "**නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය**" **යන තෙරුන් වහන්සේලා ද ඇතැම් විටෙක "ආනන්ද තෙරනුවෝ"** ද උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, නාගසමාල තෙරුන් වහන්සේ උපස්ථායක කොට දීර්ඝ මාර්ගයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු**" යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "**නැත මහණ, මා විසින් මේ මාර්ගයෙන් යා යුතුය**" යැයි වදාළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදාළ නමුත් නාගසමාල තෙරණුවෝ "**එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව**" යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍ර චීවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැලූහ. ඉන් පසු තෙරණුවෝ "**මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත**" යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම් ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මහණ, ඔය කරුණ දැනගෙනම ඒ මගින් යෑම වැළකුවෙමි**" යැයි වදාළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ මේඝිය තෙරුන් වහන්සේ උපස්ථායකයෙකු වශයෙන් කැඳවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඬු සිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේ ය. "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි**" යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ

තුන් වතාවක් ම වැළකූ නමුත් ගියේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ම තම පාත්‍ර චීවර රැගෙන එකලාව ම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේ ය. එහෙත් සුළු වේලාවකින් ම අකුසල විතර්කයන්ගෙන් පීඩිත ව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මේඝිය, මම ඔය කරුණ දැනගෙනම ඒ ගමන වැළකුයෙමි"** යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කළෙක බුද්ධත්වයෙන් විසිවන වර්ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහරහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. **"මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර - චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා"** යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහරහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥාවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි"** යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා **"කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිශාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස් ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත"** යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ආදී මහරහතන් වහන්සෙලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේ ම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන් වහන්සේ නිහඬව ම සිටියේ ය. එවිට අන් භික්ෂූන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා **"ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්ලා ගනු ව"** යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ **"ඇවැත්නි, ඉල්ලා ගත් තනතුරු කෙබඳු වේ ද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදාරණ සේක යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින් උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන් ම ඒ බව දැන මට උපස්ථාන කරන්නේ ය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැගී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කිහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ නැඟිට චීවරය ගැටවටු ගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිළි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නො දෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නො දෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසිමට මට අවසර නො දෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නො යන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දැක මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන්**

**ලාභ අපේක්ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේය යැයි මේ වචනය කියන්නේ ය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේ ය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේ ය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාර ගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.
3. ධර්මය - විනය පිළිබඳව සැකයක් උපන් විගස ඒ මොහොතෙහි දී ම එය විසඳ ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.
4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචන සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචන සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැ ඇති සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරුකර ගැනීමටත් අවකාශ ලබති. එසේ නො ලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණකුදු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේ ය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක් ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේ ය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන් වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර - චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණවත් දෙයක් නො දන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේ ය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන් - උණු පැන් - දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන අමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටී ය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටී ය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේ ය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේ ය. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක මා නිදි බරව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේ ය යැයි ඒ පහන අතින් නුමුදා ම රෑ පහන් කරන්නේ ය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි **"බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්ෂූන් අතර අග්‍ර වූහ"**. මෙසේ අග්‍ර ථානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේ ය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක් ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින්

බොහෝ ධර්මයන් ඉගෙන ගත්තේ ය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී ආනන්ද තෙරණුවෝ :-

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් "**මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූ දහසක් (82,000) උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි (84,000)**" යැයි වදළේ ය. මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දෑ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්ම සංගීතියෙහි දී "**අග්ගික භාරද්වාජ සූත්‍රය**" නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්ථ විවරණය මෙසේ ය.

## ❄ නිදාන වර්ණනාව

"**එවං මෙ සුතං**" මා විසින් මෙසේ අසන ලදී. මෙය වනාහි මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

"**එවං**" යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්ෂූන් අතර ද, උපස්ථායක භික්ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් "**මා විසින් මෙසේ අසන ලදී. එය ද අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩු ය. නො වැඩි ය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නො දත යුතුය**" යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

**"මෙ"** යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්‍මය දේශනා කළ ධර්‍ම ශාස්තෲවරයාණන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

**"සුතං"** යනු අසන ලදී යනු යි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින් ම අවධානය යොමු කොට මනා ධර්‍ම ගෞරවයෙන් ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්‍මදේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්‍ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්‍ය්‍යයෙන් යුක්තව මහේශාක්‍ය මහරහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ.

**"තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයා ය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමානය. භාග්‍යවතුන් වහන්සේගේ දායාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේ ම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ඓශ්වර්‍ය්‍ය ධර්‍ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්‍ම දායාදය ලැබ බුදු වූයේ ය"** යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෲන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව **"එවං මෙ සුතං"** යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද "එවං මෙ සුතං" යනුවෙන් **"මා විසින් මේ ධර්මය චතු වෛශාරද්‍ය විශාරද වූ, දසබල ධාරී වූ, උත්තම ස්ථානයෙහි පිහිටියා වූ, සිංහනාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්මද්වීප වූ, ධර්මසරණ වූ, සද්ධර්ම වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතුය"** යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදවන සේක.

**"එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාඛා මහ උපාසිකාව විසින් සාදවා පූජා කරන ලද පූර්වාරාමයෙහි වැඩසිටි සේක.

මෙහි **"එකං සමයං"** යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්ෂ දින පූර්වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම යාමය වශයෙන් කාලය දැක්වීම **"සමය"** නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන් ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මවු කුසෙහි පිළිසිඳ ගැනීම **"ගර්භාවක්‍රාන්ති සමය"** නම් වේ. උයනක දී මවු කුසෙන් බිහි වීම **"ජාති සමය"** නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම **"සංවේග සමය"** නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම **"අභිනිෂ්ක්‍රමණ සමය"** නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම **"දුෂ්කර ක්‍රියා සමය"** නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම **"මාරවිජය සමය"** නම් වේ. ඒ එකම පර්යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පුර්වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්ෂය ඥානය ලැබීමත් සමගම සර්වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම **"අභිසම්බෝධි සමය"** නම් වේ. සත් සති ගත කිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම **"දිට්ඨධම්ම සුඛවිහරණ සමය"** නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්මදේශනා කිරීම **"ධර්මදේශනා සමය"** නම් වේ. සූවිසි

කෝටි ලක්‍ෂ වාරයක් නවානුපූර්‍ව විහාර සමාපත්ති සුව විඳ එයින් නැඟී සිට අනුපාදිශේෂ පරිනිර්‍වාණ ධාතුවෙන් පරිනිර්‍වාණයට පැමිණීම **"පරිනිර්‍වාණ සමය"** නම් වේ.

ඒ සමයන් අතර මෙහි **"එකං සමයං"** යනු එක් ධර්‍ම දේශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, **"ඤාණ කෘත්‍ය, කරුණා කෘත්‍ය"** සමයන් අතර **"කරුණා කෘත්‍ය"** සමයකි. **"ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය"** යන ප්‍රතිපත්ති සමයන් අතර **"පරහිත ප්‍රතිපත්ති"** සමයකි. රැස් වූ විට කළ යුතු වූ **"ධර්‍මකථා සමය, දේශනා ප්‍රතිපත්ති සමය"** යන සමයන් අතර **"ධර්‍මකථා" සමයකි.** මේ සියල්ල අතරින් මෙය **"දේශනා සමයකි".**

**"භගවා"** යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දන සීලා දී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ඓශ්වර්‍ය්‍ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද, අවබෝධ කළ යුතු වූ සියලු ධර්‍ම කුසල ත්‍රිකා දී ලෙස බෙද දැක් වූ බැවින් ද **"භගවා"** නම් වන සේක.

තවද මෙහි **"එවං මෙ සුතං"** යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්‍මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්‍ම ශරීරය පමණක් ම දේශනා කරති. එබැවින් **"මේ ධර්‍මය වනාහි ශාස්තෘවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෘවරයාය"** යැයි භාග්‍යවතුන් වහන්සේ නො දැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් **"මේ ආර්‍ය්‍ය ධර්‍මය දේශනා කරන ලද්දා වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්‍වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජීවිතාශාව ඉපදවිය යුත්තේ ද"** යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්‍මයෙහි උත්සාහ උපදවයි. මෙසේ **"එවං"** යන්නෙන් දේශනා සම්පත්තිය ද **"මෙ සුතං"** යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද **"එකං සමයං"** යන්නෙන් කාල සම්පත්තිය ද **"භගවා"** යන්නෙන් දේශක සම්පත්තිය ද දක්වයි.

**"සාවත්‍ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"** සැවැත් නුවර සමීපයෙහි වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා ආරාමයක් කොට පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩසිටි සේක යන මෙහි **"සාවත්‍ථියං "** යනු මෙනම් නම් ඇති නගරයයි.

ස්වස්ථ ඍෂිවරයා හට වාස භූමිය වූ බැවින් මේ භූමිය **"සාවස්ථි"** නම් විය. මිනිසුන්ට අවශ්‍ය උප භෝග පරිභෝග භාණ්ඩ මෙහි ගබඩා කොට ඇති බැවින් **"සියල්ල ඇත්තේ ය"** යනාථීයෙන් සාවත්ථි නම් විය.

මෙසේ සියල්ල පරිපූර්ණ වූ මේ සැවැත් පුරයෙහි එන්න, කන්න, බොන්න ආදී වූ දසවිධ ශබ්දයන්ගෙන් වෙන් නොවූ ආහාර පානාදියෙන් පරිපූර්ණ වූ කොසොල් රට වැසියන්ගේ මේ අග නගරය වනාහි රම්‍ය වූ ද, දර්ශනීය වූ ද, මනෝ රමණීය වූ පුණ්‍ය භූමියක් වූයේ ය. අභිවෘධියෙන් යුක්ත වූ විපුල බවට පත් සාරවත් වූ සමෘධිමත් වූ දෙවියන්ගේ ආලකමන්දව වැනි වූ මේ සැවැත්නුවර උතුම් ය. බුද්ධ කාලයෙහි පසේනදි  කොසොල් මහ රජතුමාගේ වාස භූමිය වූයේ ද මෙහි ය. පිහිටීම් වශයෙන් අචිරවතී නදී තීරයෙහි විය. මේ නදිය වක්‍රාකාරව ගලා යන බැවින් නගරයෙහි උතුරු දකුණු දෙදිසාවෙන් ම නදිය විය. බුදුරජාණන් වහන්සේගෙන් ම ධර්මය ශ්‍රවණය කොට මඟ ඵල ලැබුවෝ පන්කෝටියක් වූහ. අනාථපිණ්ඩික සිටුතුමා විශාකා මහෝපාසිකාව වැනියවුන් නිසා මේ නුවර බැබළීමට ගියේය.

**"විහරති"** යනු දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් ගමන් කිරීම සිටීම සැතපීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් තුන් වන වර්ෂයෙහි දී මේ සැවැත් නුවරට වැඩි පළමු වතාවෙහි දී ම නව මසක් වැඩසිටි සේක. ඉන් පසු ද හතර වන වස් කාලයෙහි ද, විසි එක් වන වස්කාලයෙහි පටන් සතළිස් හතර වන වස්කාලය අවසන් වීම දක්වා වූ විසිපස් වසරක කාලයක් මේ සැවැත් නුවරම වැඩසිටි සේක.

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් පෙරෙබත් කිස හා පසුබත්

කිස යන මේ බුද්ධ කෘත්‍යයන් දෙකෙන් පෙර බත් කිස නිමවා පසුබත් කිස අවසානයෙහි බුදු ඇසින් ලොව බලා වදරණ සේක් අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාගේ තිසරණ පන්සිල්හි පිහිටීමට හේතු සම්පත් ඇති බව දැක මෙසේ සිතූ සේක. **"එහි මා ගිය කල්හි ඔහු හා මා අතර කථාවක් ඇති වන්නේ ය. එම කථාව අවසානයෙහි දේශනා කරණ ධර්ම කථාව අසා මේ බ්‍රාහ්මණයා තෙරුවන් සරණ ගොස් ශික්ෂා පදයන් සමාදන් වන්නේ ය"** යැයි දැන ඔහුගේ නිවෙස්න වෙත වැඩ ඇති වූ ධර්ම කථාව හේතුකොටගෙන මෙම බමුණා විසින් කරන ලද ආරාධනයෙන් **"වසලයෙකු වීමට හේතුවන ධර්ම තිස්හතරක් පහදා දෙමින්"** මෙම සූත්‍රය දෙසූහ. එහි මේ පිළිවෙළ කථාව දත යුතු ය. බුදුරජාණන් වහන්සේගේ දින චර්යාව **පෙර බත් කිස, පසුබත් කිස, පෙරයම් කිස, මැදියම් කිස, පැසුළුයම් කිස** යැයි පස් වැදෑරුම් වේ.

## ☸ පෙර බත් කිස

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සිංහල පැය ක්‍රමය අනුව තිස් පැයක් ඇති රාත්‍රියෙන් පැය විසිතුනකුත් තුනෙන් එකක් ගෙවී ගිය පසු අලුයම (වර්තමාන වේලාවෙන් අලුයම 04.40 ට) පමණ අවදි වී උපස්ථායකයන්ට අනුග්‍රහය පිණිස ද, ශරීරයාගේ පහසුව පිණිස ද මුහුණ සේදීමාදී සිරුර පිළිදැගුම් කොට පිඬු පිණිස වේලාව පැමිණෙන තෙක් මහා කරුණා සමවතට සමවැදී පූර්ව බුද්ධ ශාසනයන්හි දී සීල සමාධි ප්‍රඥා ගුණ පිරුවන්ගෙන් කවර කෙනෙකුන් අද තමන් වහන්සේගෙන් පිහිට ලබන්නේ ද යැයි බලා වදරා අරුණ නැගීමට තව කාලය ඇත්තේ නම් එම කාලය ද ඵල සමවත් සුවයෙන් කල් ගෙවා පිඬු පිණිස ආසන්න වේලාවෙහි අඳනය මනාකොට හැඳ කාය බන්ධනය බැඳ රත් පැහැති සුගත චීවරය පොරවාගෙන පිඬු පිණිස වැඩීමට සිතන සේක. එවිට රතු නෙළුම් මල් දෙකක් මැදට පැමිණෙන බඹරෙකු මෙන් ශෛලමය පාත්‍රය භාග්‍යවතුන් වහන්සේගේ රත් පැහැති දෙයත් මැදට පැමිණෙති. භාග්‍යවතුන් වහන්සේ ඇතැම් දිනයක දී භික්ෂු සංඝයා පිරිවරා ගමට හෝ නියම්ගමට හෝ පිවිසෙති. ඇම් දිනයක සාමාන්‍ය කෙනෙකුන් සේ එකලාව ම ද, ඇතැම් දිනයක නොයෙක් ප්‍රාතිහාර්යයෙන් වඩිති.

පිඬු පිණිස පිවිසෙන්නා වූ ලෝ නාථයන් වහන්සේගේ ඉදිරියෙන් ගොස් මොලොක් වාතයෝ පොළව පිරිසිදු කෙරෙති. වැහි වලාවන් දිය බිඳු ඉසිමින් මඟෙහි දූවිලි දුරු කොට භාග්‍යවතුන් වහන්සේට ඉහළින් අහසෙහි වියනක් මෙන් සිටිති. අනෙක් වාතයක් මල් ගෙනවිත් මාර්ගයෙහි අතුරුවති. අනෙක් වාතයක් ඒ මල් නැටි යටට සිටින සේ පෙති උඩට සිටින සේ සකසති. උස් බිම් පහත් වෙති. වළ තැන් ගොඩ වෙති. පා තබන වේලාවෙහි සම වූ භූමිය ම වෙයි. සුව පහස ඇති නෙළුම් මල් පාදයෝ පිළිගනිති. භාග්‍යවතුන් වහන්සේ නුවර දෙරටුවට වැඩ දකුණු පාදය ඉදිරියට තබනවාත් සමගම බුද්ධ ශරීරයෙන් ෂඩ් වර්ණ රශ්මීහු නික්ම ප්‍රාසාද, කූටාගාර ආදියෙහි රන් දිය ඉසින්නාක් මෙන් එහා මෙහා විවිධාකාරයෙන් දුවති. ඇත්, අස්, පක්ෂි ආදීහු තම තමන් ගේ ස්ථානයන්හි සිටියාහුම මිහිරි හඬින් නාද කරති. බෙර වීණා ආදීහු ද, මිනිසුන්ගේ කයෙහි පැළඳි ආභරණ ආදීහු ද ඉබේම නාද වෙති. කයෙන් ගලවා තබන ලද ආභරණ ඉබේම ඇවිත් කයෙහි පැළඳෙති. මෙසේ ආශ්චර්යවත් දේ සිදුවෙත් ම අද භාග්‍යවතුන් වහන්සේ මෙම වීථියෙහි පිඬු පිණිස වැඩි සේක යැයි මනුෂ්‍යයෝ දැනගනිති. ඔවුහු මනා සේ හැඳ පෙරව සුවඳ මල් ආදිය ගෙන ගෙයින් නික්ම ඇතුල් වීථියට පැමිණ පෙරමඟ බලා සිට භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි සුවඳ මල් ආදියෙන් පූජා කොට වැඳ **"ස්වාමීනි, අපට භික්ෂූන් දස නමක් ලබා දෙන්න, අපට විසි නමක් ලබා දෙන්න, අපට සියක් මක් ලබා දෙන්න"** යැයි භාග්‍යවතුන් වහන්සේගේ ද පාත්‍රය ගෙන අසුන් පනවා සකස් කොට පිණ්ඩපාතයෙන් පූජා කරති. භාග්‍යවතුන් වහන්සේ කරන ලද බත්කිස ඇත්තේ ඔවුන්ගේ සිත් බලා අනුමෝදනා ධර්මය දේශනා කරති. එයින් ඇතැම්හු සරණාගමනයෙහි පිහිටති. ඇතැම්හු පඤ්ච ශීලයෙහි පිහිටති. ඇතැම්හු සෝවාන් හෝ ඇතැම්හු සකෘදගාමී හෝ ඇතැම්හු අනාගාමී හෝ ඵලයන්ට පැමිණෙති. ඇතමෙක් පැවිදි ව අග්‍ර ඵලය වූ රහත් බවට හෝ පැමිණෙති. මෙසේ ඒ ඒ අයුරින් ජනයාට අනුග්‍රහ කොට ආසනයෙන් නැගිට විහාරයට වඩිති. එහි වෘතාකාර මළුවෙහි පනවන ලද උතුම් බුද්ධ ආසනයෙහි වැඩ හිඳිති. අන් භික්ෂූහු ද දන් වළඳා අවසන් වී විහාරයට පැමිණි පසු ඒ බව උපස්ථායකයා භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙයි. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ගන්ධ කුටියට පිවිසෙති. මේ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ **පෙර බත් කිස** යි.

## ☸ පසුබත් කිස

භාග්‍යවතුන් වහන්සේ මෙසේ කරණ ලද පෙර බත් කිස ඇත්තේ ගඳකිළියෙහි මණ්ඩල මාලයෙහි පනවන ලද උතුම් බුද්ධ ආසනයෙහි වැඩ හිඳ පා සෝදා පා පුටුවෙහි තබා භික්ෂු සංඝයා හට අවවාද කරති. "**මහණෙනි, අප්‍රමාදී ව කටයුතු කරව්. ලෝකයෙහි බුද්ධෝත්පාදය දුර්ලභ ය. මිනිසත් බව ලැබීම දුර්ලභ ය. ක්‍ෂණ සම්පත්තිය දුර්ලභ ය. පැවිද්ද දුර්ලභ ය. සද්ධර්ම ශ්‍රවණය දුර්ලභ ය**". මෙසේ අවවාද කිරීම "**සුගතොවාදය**" නම් වේ. ඉන් පසු භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට වැඳ කමටහන් විචාරති. භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ගේ චරිත බලා කමටහන් දෙති. භික්ෂූහු ද කමටහන් ඉගෙන භාග්‍යවතුන් වහන්සේට වැඳ තම තමන් වසන ස්ථානයන්ට යති. ඔවුන්ගෙන් ඇතමෙක් ආරණ්‍යයට ද, ඇතමෙක් වෘක්‍ෂ මූලයකට ද, ඇතමෙක් පර්වත ගුහා ආදියකට ද, ඍද්ධි ලාභී වූ ඇතමෙක් චාතුර්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුෂිතය, නිර්මාණ රතිය, පරිනිර්මිත වසවර්තිය යන දිව්‍ය භවන් ආදියට ද යති. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ සවස් යාමය (ප.ව.02.00 සිට 06.00 දක්වා) තුන් කොටසකට බෙදා ගෙන එයින් පළමු කොටසෙහි ගඳකිළියට පිවිස ඉඳින් කැමති වන සේක නම් සිහි නුවණින් යුතුව දකුණු ඇලයෙන් සිංහ සෙය්‍යාවෙන් කල් ගෙවයි. ඉක්බිති සන්සිඳවූ කය ඇතිව එයින් නැගිට දෙවැනි කොටසෙහි මහා කරුණා සමවතට සමවැදී දසදහසක් සක්වළ පුරාවට මහා කරුණා නුවණ විහිදුවා එයින් නැගී සිට සවස් කාලයෙහි ඉතිරි කොටස, රාත්‍රී ප්‍රථම යාමය, මධ්‍ය යාමය තෙක් ම කවරෙක් නම් තමන් වහන්සේගෙන් පිහිට ලබන්නේ දැයි බලා වදරණ සේක. පෙරවරු කාලයෙහි දන් දී බණ ඇසුවෝ ද නොහැකි වූවෝ ද සන්ධ්‍යාවෙහි හොඳින් හැඳ පෙරව සුවඳ මල් ආදිය ගෙන විහාරයෙහි එක්රැස් වෙති. භාග්‍යවතුන් වහන්සේ තුන් වන කොටසෙහි සුදුසු ප්‍රාතිහාර්‍ය්‍යයෙන් යුතුව දම් සභාවට වැඩ පනවන ලද බුද්ධ ආසනයෙහි වැඩ හිඳ කාලය හා ප්‍රමාණය දැන ධර්මදේශනා කොට එම ජනයාට අඳුරට පෙර තම නිවෙස්වලට යාමට කාලය ඉතුරු කොට දේශනාව නවත්වති. මෙය **පසුබත් කිස** යි.

## ☸ පෙරයම් කිස

ඉන් පසුව ශරීරයෙහි දෙස් සමනය කර ගැනීමට කැමති වන සේක නම් බුද්ධාසනයෙන් නැඟිට උපස්ථායකයා විසින් පැන් පිළියෙල කරණ තැනට වැඩ උපස්ථායකයා අතින් ජල සාටකය ගෙන නාන කොටුවට පිවිසෙති. උපස්ථායකයා ද බුද්ධාසනය ගෙන ගඳකිළි පිරිවෙනෙහි පනවයි. භාග්‍යවතුන් වහන්සේ ජලයට බැස දෙතුන් වරක් එබී ශරීරය සෑතු ගන්වා ගෙන ගොඩට ඇවිත්, ජනයා දිය ස්නානය කොට ගොඩට ඇවිත් ශරිරයෙහි ජලය වේළෙන තෙක් මඳ වේලාවක් සිටින්නා සේ ලෝක චාරිත්‍ර ගරු කිරීමක් ලෙස මඳ වේලාවක් වැඩසිටින සේක. ඉන් පසු උපස්ථායකයා විසින් අඳනය පිළිගැන්වූ වූ විට එය හැඳගෙන දිය සළුව උපස්ථායකයාට දෙන්නේ ය. ඉන් පසු උපස්ථායකයා කාය බන්ධනය පිළිගැන්වූ වූ විට එය බැඳගන්නේය. අනතුරුව උපස්ථායකයා විසින් රත් පැහැති උතුරු සඟ සිවුර පිළිගැන්වූ වූ කල්හි එය මනාකොට පොරවාගෙන ගඳකිළි පිරිවෙන වෙත වැඩ උපස්ථායකයා විසින් පනවන ලද බුද්ධ ආසනයෙහි වැඩ හිඳ මඳ වේලාවක් විවේක සුවයෙන් කල් ගෙවති. ඉක්බිති භික්ෂූහු ඒ ඒ තැනින් අවුත් භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථානයට යති. එහි දී ඇතමෙක් ප්‍රශ්න අසති. ඇතමෙක් කමටහන් විචාරති. ඇතමෙක් ධර්‍ම දේශනාවට ආරාධනා කරති. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අදහස් සපුරමින් සවස් කාලය (ප.ව.06.00 සිට රාත්‍රී 10.00දක්වා ) ගෙවන සේක. මෙය **පෙරයම් කිස** යි.

## ☸ මැදියම් කිස

ඉන් පසු භික්ෂූහු නැඟිට භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට නික්ම ගිය පසු දසදහසක් ලෝකධාතු වැසි වූ දෙවි බඹුන් අවකාශ ලැබ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ගොතාගෙන ආ ලෙසින් ප්‍රශ්න විචාරති. භාග්‍යවතුන් වහන්සේ යටත් පිරිසෙයින් අකුරු හතරකින් වත් යුත් දේශනාවකින් එම ප්‍රශ්න විසඳමින් රාත්‍රී(10.00 සිට 2.00 දක්වා) මැඳියම් රැය දෙවියන් වෙනුවෙන් ගෙවන සේක. මෙය **මැදියම් කිස** යි.

## ☸ පැසුළුයම් කිස

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ පශ්චිම යාමය (රාත්‍රී 02.00 සිට අරුණෝද්ගමනය දක්වා වූ කාලය) තුන් කොටසකට බෙදා ගෙන, පෙර බත් කිස පටන් දවසේ බොහෝ වේලාවක් ඉඳගෙන ම එකම ඉරියව්වෙන් වැඩ සිටීමට සිදු වූ බැවින් කය සැහැල්ලු කරගැනීම පිණිස එයින් පළමු කොටස (02.00 සිට 03.20 දක්වා) සක්මන් කරන සේක. ඉන් පසු දෙවැනි කොටස (03.20 සිට 04.40දක්වා) ගඳකිළියට පිවිස දකුණු ඇලයෙන් සිහිනුවණින් යුතුව සිංහ සෙය්‍යාවෙන් සැතපෙන සේක. තෙවැනි කොටසෙහි (04.40 ට) අවදි වී උපස්ථායකයන්ට අනුග්‍රහ පිණිස ද, ශරීර පහසුව පිණිස ද මුහුණ සේදීමාදී ශරීර කෘත්‍යයන් කොට බද්ධ පයඞ්කයෙන් වැඩ හිඳ පූර්ව බුද්ධ ශාසනයන්හි දී දාන සීලාදී වශයෙන් පාරමී ගුණ බෝධිපාක්ෂික ධර්ම පරිපූර්ණ කොට ඇත්තා වූ තමන් වහන්සේ හමුවෙහි මාර්ග ඵල ලැබීමට පින් ඇතියවුන් කවුරුන් ද යැයි බුදු ඇස විහිදුවා දසදහසක් ලෝක ධාතූන් බලා වදාරණ සේක. මෙය **පැසුළුයම් කිස** යි. මෙහි මධ්‍යාහ්නයෙහි පටන් පසු ද අලුයම අවදි වීම දක්වා වූ බුද්ධ කෘත්‍යයන් **පසුබත් කිස** නම් වේ.

භාග්‍යවතුන් වහන්සේ එදින පසුබත් කිස අවසානයෙහි බුදුන්, දහම් හා සඟුන් කෙරෙහි ද, දාන, ශීල, උපෝසථ කර්මාදියෙහි ද නොකරන ලද අධිකාර ඇත්තේද කරණ ලද අධිකාර ඇත්තේද උපනිඃශ්‍රය සම්පත් නොමැති හා උපනිඃශ්‍රය සම්පත් ඇති සත්වයන් බලන්නට අලුයම බුදු ඇසින් ලොව බලා වදාරණ සේක් මෙම අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තුමා හට සරණ සීලයෙහි පිහිටීමට ඇති හේතු සම්පත් දැක "**මා ඔහුගේ නිවෙස්න වෙත වැඩි කල්හි එම බ්‍රාහ්මණයා හා මා අතර කථාවක් ඇති වන්නේ ය. එම කථාව අවසානයෙහි ධර්මය අසා එම බමුණා සරණ සීලයෙහි පිහිටන්නේ ය**" යි දැන එහි වැඩ වදාරා ඔහු සමග කථාවක් උපදවා මෙම සූත්‍රය දේශනා කළ සේක.

"**අථ ඛො භගවා**" මෙසේ ජේතවනාරාමයෙහි වැඩ සිටියා වූ භාග්‍යවතුන් වහන්සේ "**පුබ්බණ්හ සමයං**" දවස ආරම්භ වන අරුණෝදයේ පටන් ඉර මුදුන් වීම දක්වා වූ දවසේ ප්‍රථම භාගය "**පූර්වාහ්ණය හෙවත් පෙරවරු කාලය**" නම් වේ. ලොව පහළවල සියලු

බුදු පසේබුදු මහරහතන් වහන්සේලා ගේ ආහාර සෙවීමේ කාලය මෙම කාලයයි. භාග්‍යවතුන් මෙසේ වූ පෙරවරු කාලයෙහි **"නිවාසෙත්වා"** අඳනය මනාකොට හැඳ පටි ධාතුව බැඳ **"පත්තචීවරමාදය"** ගලවළුවෙහි පටන් සිරස ද වළලු කර පටන් දෙ අත්ල ද, කෙණ්ඩ මාංශය පටන් දෙපතුල ද හැර හාත්පසින් ඉදිරි පසින් ද පසුපසින් ද අන් දෙ පසින් ද උස් පහත් නොවන සේ දෙකොන් සමව සිටින සේ රත් පැහැති දෙපට සිවුර මනාකොට පොරවාගත් කල්හි රත් පියුම් දෙකක් මැදට පැමිණෙන බඹරෙකු සේ ඉඳුනිල් මිණි වන් ශෛලමය වූ පාත්‍රය භාග්‍යවතුන් වහන්සේගේ දෑතට පැමිණෙති. ඉන් පසු මෙසේ **"පත්තචීවරමාදය සාවත්ථියං පිණ්ඩාය පාවිසි"** රම්‍ය වූ සැවැත් නගරයට එකලාව ම පිඬු පිණිස වැඩි සේක. **"තෙන ඛො පන සමයෙන අග්ගික භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ"** මෙහි **"අග්ගික"** යනු බමුණන් ගිනි පිදීම හේතුවෙන් ඇති වූ අනුවර්ත නාමයකි. **භාරද්වාජ""** යනු උපන් ගෝත්‍රය අනුව මව්පියන් තැබූ නාමයයි. **"බ්‍රාහ්මණ"** යනු බ්‍රහ්මයා ශාස්තෘ තැන්හි තබා වඳින පුදන ගරු කරන බැවින් ව්‍යවහාර කරන නාමයකි. **"අග්ගි පජ්ජලිතො හොති"** මේ බමුණාගේ නිවසට පැමිණෙන මාර්ගයෙහි නිවස ඉදිරිපිට බ්‍රහ්ම ඇදහීමට ගිනි පුදන ශාලාවක් විය. එදින අලුයම් වෙලෙහි බ්‍රහ්මයා ශාස්තෘ කොටගත් අග්ගික භාරද්වාජ නම් මිසදිටු බමුණා බ්‍රහ්ම ඇදහීම පිණිස එහි ගිනි මැලයක් දල්වා එම ගින්න වැඩීමට දර දමමින් සිටියේ ය **"ආහුති පග්ගහිතා"** යනු අලුයම සුවඳ පැනින් නා මහත් ගෞරවයෙන් කිරිබතක් උයා එම කිරිබතත් සමග ගිතෙල් මී පැණි ආදිය බ්‍රහ්මයාට පිදීම් වශයෙන් ගින්නට දමමින් සිටියේ ය.

**"අථ ඛො භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො යෙන අග්ගික භාරද්වාජස්ස බ්‍රාහ්මනස්ස නිවෙසනං තෙනුපසංකමි"** භාග්‍යවතුන් වහන්සේ සැවැත් පුරයෙහි සියලු ජනයාට අනුග්‍රහ පිණිස ද, ආහාර සන්තුෂ්ටිය සඳහා ද ගෙපිළිවෙලින් පිඬු සිඟා වඩිමින් මේ අග්ගික භාරද්වාජ බමුණාගේ නිවෙස්න ඉදිරියෙහි බමුණා යම් තැනෙක්හි ගිනි පුදමින් සිටියේ වේද, එතැනට වැඩි සේක.

**"අද්දසා ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතොව ආගච්ඡන්තං"** අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ තම නිවෙස්න වෙත වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර තියා ම දුටුවේ ය. දැක බමුණාගේ සිත නො සතුටට පත් විය.

කුමක් හෙයින් සියලු ආකාරයෙන් හාත්පසින් ම පැහැදුම් එළවන භාග්‍යවතුන් වහන්සේ දැක බමුණාගේ සිත නො පැහැදුණේ ද යත්? මේ බමුණා මංගල සම්මත කටයුතුවල දී ශ්‍රමණ දර්ශනය අවමංගලයක් යැයි සිතයි. එබැවින් මහා බ්‍රහ්මයාගේ ආහාර අනුභව කරන වේලාවෙහි කාලකන්නි වූ හිස මුඩු කළ ශ්‍රමණයෙකු මාගේ ගෙට එළඹියේ ය යැයි සිත කිලිටි කර ගත්තේ ය. එවේලෙහි වෙන යම්කිසි යහපත් අදහසක් සිහි කරගත නොහැකි ව කෝපයෙන් යුක්ත වූයේ නො සතුටු සිතින් නො සතුටු වචනයෙන් භාග්‍යවතුන් වහන්සේට **"තත්‍රෙව මුණ්ඩක, තත්‍රෙව සමණක, තත්‍රෙව වසලක තිට්ඨාහි"** යනුවෙන් නිග්‍රහ කළේ ය.

එහි **"තත්‍රෙව මුණ්ඩක තිට්ඨාහි"** යන්නෙන් හිස මුඩුකළ තැනැත්තා අපිරිසිදු ය. එසේ අපිරිසිදු වූවත් බමුණු පුදන්නෙක් නොවේ යැයි ඔහුගේ පිළිගැනීම විය. එසේම හිස මුඩුකළ හෙයින් ඉඳුල් ආහාර ලබාගැනීමට මෙතෙමේ මේ ප්‍රදේශයට පැමිණීමට නුසුදුසු ය. **"හිස මුඩුකළ තැනැත්ත, ඔතන ම සිටුව"** යැයි කීවේය.

**"තත්‍රෙව සමණක තිට්ඨාහි"** යන්නෙන් ශ්‍රමණයෙකු වී වුවත් කයෙහි කිලුට වණීනා නො කෙරේ ය යැයි ශ්‍රමණ භාවය පිළිකුල් කරමින් **"ශ්‍රමණය ඔතන ම සිටු"** යැයි කීවේය..

**"තත්‍රෙව වසලක තිට්ඨාහි"** යන්නෙන් මෙසේ කෝප වශයෙන් දෙස් නැගුවා පමණක්ම නොව, වසලයන් හෝ පැවිදි කොට ඔවුන් සමග එකට සම්භෝග පරිභෝග කිරීමෙන් සතුටු වන මෙතෙමේ වසලයෙක් හෙවත් පාපතරයෙක් යැයි පිළිකුල් කරමින් **"වසලය ඔතන ම සිටුව"** යැයි කීවේය. තවද වසල ජාතීන්ගේ පැහැය දැකීමෙන් හෝ වසලයන්ගේ මන්ත්‍ර ඇසීමෙන් හෝ පාපයක් වේය යැයි සිතන්නේ, මෙසේ වසල වාදයෙන් නිග්‍රහ කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙම බමුණා තමන්වහන්සේට මෙසේ නිග්‍රහ කළේ වුවත් අති ප්‍රසන්න වූ පැහැපත් මුහුණින් යුක්තව මිහිරි හඬින් බමුණා කෙරෙහි අනුකම්පාවෙන් සිහිල් වූ සිතින් සියලු සත්වයන් කෙරෙහි ඇති අසමාන වූ තාදී භාවය ප්‍රකාශ කරමින් **"ජානාසි පන ත්‍වං බ්‍රාහමණ වසලං වා වසලකරනෙ වා ධමෙම"** යනුවෙන් බ්‍රාහ්මණය, නුඹ වසල ධර්‍ම හෝ වසල බවට පමුණුවන ධර්‍ම හෝ දන්නෙහි ද යැයි අසා වදාළසේක.

ඉක්බිති බමුණා භාග්‍යවතුන් වහන්සේගේ මුහුණෙහි පැහැයෙන් දක්වූ තාදීභාවය දන අනුකම්පාවෙන් සිසිල් වූ සිතින් පිට කළා වූ මධුර ස්වරය අසා අමෘතය ඉසින ලද හදක් මෙන් වූයේ සතුටු වූ සිතින් යුක්තව ඉතා ප්‍රසන්න වූ ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව නිහතමානී වී ඉහත දී බ්‍රාහ්මණ මානයෙන් යුතුව විස තැලි නැංවීම සමාන වූ වචන අත්හැර මෙසේ සිතුවේ ය. "ඒකාන්තයෙන් මම හීන වූ ජාතියෙහි උපන් තැනැත්තා වසලයෙකු යැයි විශ්වාස කළෙමි. එහෙත් හෙතෙම පරමාර්‍ථ වශයෙන් වසලයෙකු නොවේ. මේ ගෞතමයන් වහන්සේ පහත් කුලයක උපන්නෙකු ද නොවේ. එබැවින් මම සිතූ ලෙසින් වසලයෙකු නොවේය" යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ අමතා **"නක්‍ඛා'හං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධමෙම, සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා'හං ජානෙය්‍යං වසලං වා වසලකරනෙ වා ධමෙම"** යනුවෙන් ස්වාමීනි ගෞතමයන් වහන්ස, මම වසල බව "කුමක් ද යැයි කියා හෝ වසල බවට පමුණුවන ධර්‍ම මොනවා ද යැයි කියා හෝ නො දනිමි. භාග්‍යවත් ගෞතමයන් වහන්සේ මට තේරුම් ගැනීමට හැකි වන්නේ ද, එලෙසට වසල ධර්‍මයන් ද, වසල කරණ ධර්‍මයන් ද දේශනා කරන සේක්වා' යැයි ආරාධනා කළේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"තෙනහි බ්‍රාහමණ සුනාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමි"** යනුවෙන් වදාළසේක.

මෙහි **"සුනාහි"** යන්නෙන් **"එසේ වී නම් බ්‍රාහ්මණය, නුඹ ඒ වසල ධර්‍ම දැනගනු කැමැත්තෙහි නම් මැනවින් කන් යොමු කරමින් සෝතින්ද්‍රියෙහි විසිර යාම වළක්වමින් මෙම දේශනාවට ම කන යොමු කොට ධර්‍ම ගෞරවයෙන් අසව"** යනුයි. **"සාධුකං මනසිකරොහි"** යන්නෙන් **"සිතෙහි අවධානය ගැඹුරට යොදා ගනිමින් නො විසිරුණා වූ මනා සිහියෙන් යුතුව මෙනෙහි කරව"** යනුයි.

එසේම **"සුනාහි සාධුකං මනසිකරොහි"** යන්නෙන් ධර්‍මයෙහි ගැඹුරු බව ද, එහි අර්‍ථ විග්‍රහයන් ගැඹුරු බව ද, දේශනා ක්‍රමය ගැඹුරු බව ද, එය මාර්‍ග ඥානයෙන් අවබෝධ කරගැනීම අතිශයින් ගැඹුරු බව ද දත යුතු යැයි දක්වයි. මෙසේ ගැඹුරු වූ කල්හි **"මම කෙසේ පිහිටක් ලබන්නෙම් ද"** යැයි ධර්‍ම ශ්‍රවණයට පසු බසින්නා වූ බ්‍රාහ්මණ තුමා හට ධර්‍ම ශ්‍රවණයට උත්සාහ ඇති කරවීම් පිණිස **"භාසිස්සාමි"** යන්නෙන් බ්‍රාහ්මණය, මනාව ධර්‍ම ගෞරවයෙන් අසන්නෙහි නම්, මනාකොට අර්‍ථ සිහි කරන්නෙහි නම් අර්‍ථ ව්‍යඤ්ජනයන්ගෙන් පරිපූර්‍ණ කොට යම් සේ ඔබට දත හැකි වන්නේ ද එසේ දේශනා කරන්නෙමි" යැයි වදාළසේක. **"එවං හො'ති බො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි" "ස්වාමීනි, භාග්‍යවත් ගෞතමයන් වහන්ස, එසේය. මැනවින් අසන්නෙමි. මැනවින් මෙනෙහි කරන්නෙමි"** යැයි පිළිතුරු දුන්නේ ය. **"භගවා එතදවොච"** භාග්‍යවතුන් වහන්සේ **කොධනො උපනාහි** යනාදී වශයෙන් ගාථා විස්සකින් එම වසල ධර්‍ම සිව්තිස වදාළසේක.

## ❈ වසල කරන ධර්‍ම

**"කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො,**
**විපන්නදිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති"**

1. **"කොධනො"** යනු ක්‍රොධයයි. සිතෙහි හටගන්නා වූ දණ්ඩෙන් පහර ලත් සර්‍පයෙකු සේ අන්‍යයන්ට විරුද්ධව නැඟී සිටින ස්වභාවය ක්‍රෝධ නම් වේ. මෙය ගින්නක් මෙන් සිත දවන තවන පෙලන ස්වභාවයෙන් යුක්ත ය. මෙය නව ආඝාත වස්තූන් නිසාම හට ගන්නකි.

**තත්‍ථ කතමො කොධො? යො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස අයං වුච්චති ''කොධො''**

එහි ක්‍රෝධය නම් කවරේ ද? යම් ක්‍රෝධයක් ක්‍රෝධ අයුරක් ක්‍රෝධ කළ බවක් දෝෂයක් දූෂ්‍ය අයුරක් දූෂිත බවක් ප්‍රකෘත්ති භාවය හැරීමක් ව්‍යාපාදකාරයක් ව්‍යාපාදිත බවක් විරෝධයක් ප්‍රතිවිරෝධයක් සැඩ බවක් අපරිපූර්ණ වචන ඇති බවක් සිතෙහි නොසතුටු බවක් වේ ද, මෙය ක්‍රෝධය නම් වේ.

2. **"උපනාහී"** එම ක්‍රෝධය ම යම් කෙනෙකු පිළිබඳව නැවත නැවත හටගන්නා වූ වෛරය **උපනාහය** නම් වේ.

**"තත්‍ථ කතමො උපනාහො? පුබ්බකාලං කොධො, අපරකාලං උපනාහො. යො එවරූපො උපනාහො උපනය්හනා උපනය්හිතත්තං අට්ඨපනා ඨපනා සණ්ඨපනා අනුසංසන්දනා අනුප්පබන්ධනා දළ්හීකම්මං කොධස්ස අයං වුච්චති ''උපනාහො"**

3. **"මක්ඛී"** යනු අන්‍යයන්ගේ ඇති ගුණ මකා දැමීම, අනුන්ගේ ගුණ කථා කිරීමට අකමැත්ත, නොකියා ම බැරි තැනක දී ඇත්තා වූ ම ගුණය සුළු කොට කියයි. මෙසේ වූ ගුණමකු ස්වභාවය මක්ඛ නම් වේ.

**"තත්‍ථ කතමො මක්ඛො? යො මක්ඛො මක්ඛායනා මක්ඛායිතත්තං නිට්ඨුරියං නිට්ඨුරියකම්මං අයං වුච්චති ''මක්ඛො"**

4. **"පාපමක්ඛී"** ඉහත කී ගුණමකු ස්වභාවය ම පාපයක් බැවින් එය පාපමක්ඛි නම් වේ. සිල්වතුන්ට ද ගුණවතුන්ට ද මව්පිය ආදීන්ට ද, මිත්‍රයන්ට ද ද්‍රෝහි කම් කිරීමට හේතුවන පාපයකි.

5. **"විපන්නදිට්ඨී"** විනාශ වූ සම්මා දිට්ඨිය ඇති බවයි. ප්‍රාණඝාත, සොරකම, කාම මිථ්‍යාචාරාදියෙහි විපාක නැත, කුසලාකුසල කර්ම නැත, ඒවායේ විපාක නැත, හේතුඵල නැත, මෙලොව පරලොව කියා දෙයක් නැත, ලොව මැවුම් කාර දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් ඇත, සෑම දෙයක් ම මිනිසාගේ ප්‍රයෝජනය පිණිස මවන ලද්දේ ය යන මේවා මිථ්‍යාදෘෂ්ටියට අයත් ය. ප්‍රධාන වශයෙන් මෙය දස වැදෑරුම් වේ.

1. දන් දීමෙහි විපාක නැත,
2. මහා දනයන්හි (යාග) විපාක නැත.
3. ආගන්තුකයන්ට දීම, ආරාධනා කොට දීමාදියෙහි විපාක නැත.
4. පින් පවු කිරීමෙහි විපාක නැත.
5. පරලොව සිටියවුන් මෙලොවට එන්නේ නැත.
6. මෙලොව සිටියවුන් පරලොව යන්නේ නැත.
7. මවට කරන හොඳ නරකවල විපාක නැත.
8. පියාට කරන හොඳ නරකවල විපාක නැත.
9. මරණින් මතු උපදින්නෙක් නැත.
10. සම්‍යක් ප්‍රතිපදාවෙන් නිර්වාණාවබෝධය කළා වූ මෙලොව පරලොව පිළිබඳව තත්වාකාරයෙන් දන ලොවට ප්‍රකාශ කරණ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැත. යනුවෙන් ගැනීම දස වස්තුක මිථ්‍යාදෘෂ්ටියයි.

6. **"මායාවී"** තමා විසින් වැරදි කොට ඒ වරද සැඟවීම මායාවයි.

**"තංජඤ්ඤා වසලො ඉති"** මෙසේ මිනිසත් බව ලැබූවෙකු මේ කියන ලද ධර්ම සයෙන් යුක්ත වූ පුද්ගලයා වසලයෙක් යැයි දත යුතු ය. තම අදහස් ඉටු කර ගැනීමට ගොස් බලාපොරොත්තු සුන් වී අන් අය හා සමානව ධන ධාන්‍යයෙන් හෝ ආධ්‍යාත්මික ගුණයෙන් සම නොවී පසු බසින්නට වීමෙන් මේ හීන ධර්මයන්ගෙන් වැස්සෙන බැවින් මේවාට ගැති වන බැවින් නුනුවණින් මෙනෙහි කිරීම හේතුවෙන් මේ ක්‍රෝධාදී ධර්ම සය කරන්නේ ද හෙතෙම වසලයෙක් යැයි දත යුතුය.

**එකජං වා ද්විජං වා'පි - යොධ පාණානි**
**හිංසති,යස්ස පාණෙ දයා නත්ථි - තං ජඤ්ඤා වසලො ඉති.**

මෙහි **"එකජ"** යනු **ජලාබුජ, සංසෙදජ, ඕපපාතික** යෝනීන්හි උපදින සත්වයෝ ය. එම සත්වයන් ගේ උපත එක් වරකදී ම සිදුවන බැවින් **"එකජ"** නම් වේ. **"ද්විජ"** නම් බිජුවලින් උපදින සත්වයෝ ය. ප්‍රථමයෙන් මව්කුසෙන් බිජුවට වශයෙන් ද, පසුව බිජුවට තුලින්

සත්වයකු වශයෙන් ද යැයි මෙසේ දෙවතාවක දී උපදින බැවින් "**ද්විජ**" නම් වේ.

7. "**එකජං වා ද්විජං වා**" මෙසේ ඒකජ වූ හෝ ද්විජ වූ හෝ සතර යෝනියෙන් යම් තැනක උපන් සත්වයෙකුට "**පාණානි හිංසති**" යමෙක් හිංසා පීඩා කිරීම හෝ මැරීම කරයි ද, අනුන් ලවා කරවයි ද, "**යස්ස පාණෙ දයා නත්‍ථි**" යමෙකුගේ සිතෙහි සත්වයන් කෙරෙහි දයාව අනුකම්පාව නැත්තේ වේද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො හන්තිපරිරුන්ධති - ගාමානි නිගමානි ච,**
**නිග්ගාහකො සමඤ්ඤාතො - තඤ්ජඤ්ඤා වසලො ඉති.**

8. **හන්ති** යමෙක් ගම් නියම්ගම් නගර ජනපද විනාශ කරයි ද, **පරිරුන්ධති** ගම් නියම්ගම් ආදිය වටකර ගනී ද, **නිග්ගාහකො සමඤ්ඤාතො** ගම් නියම්ගම් නගර වැසියන්ට පහර දෙයි ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**ගාමෙ වා යදි වා'රඤ්ඤෙ - යං පරෙසං මමායිතං,**
**ථෙය්‍යා අදින්නං ආදියති - තං ජඤ්ඤා වසලො ඉති.**

9. "**ගාමෙ වා**" යමෙක් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ නගරයෙහි හෝ ආරඤ්ඤ නම් මේ ගම් නියම්ගම් උපචාර සීමාවන් හැර ආරණ්‍යයන්හි හෝ "**යං පරෙසං මමායිතං**" මෙය මගේ යැයි අයිතිය හඟවන ලද දෙය ථෙය්‍යා සොර සිතින් යුතුව "**අදින්නං**" අනුන් සතු වූ තමන්ට අයිතිය අත්හැර නො දුන් දෙය "**ආදියති**" පස් විසි අවහාරයන්ගෙන් යම් ක්‍රමයකින් පැහැර ගනී ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

"**යො හවෙ ඉනමාදය - චුජ්ජමානො පලායති,**
**නහි තෙ ඉනමත්‍ථී'ති - තං ජඤ්ඤා වසලො ඉති**"

10. "**ඉනමාදය**" යමෙක් තමා සතු ධනය බැහැර තැනක සඟවා තබා තම ඤාති, මිත්‍රාදීන්ගෙන් හෝ බැංකු ආදී ව්‍යාපාරික ආයතනයකින්

හෝ මෙපමණ පොලියත් සමග දෙමි යැයි කියා හෝ ලාභයෙන් කොටසක් දෙමි යැයි කියා හෝ මෙපමණ වැඩිපුර ප්‍රමාණයක් දෙමි යැයි කියා හෝ වැඩියෙන් ණය ගෙන "**චුජ්ජමානො පලායති**" පසුව ඒ ණය හිමියන් පැමිණ ආපසු ඒ ධනය ඉල්ලූ විට "**මම නුඹෙන් ගත් ණයක් නැත**" යැයි කියා ද, දූක අහක බලයි ද, මග හැර පලා යයි ද, ණය හිමියන් පැමිණෙන විට නිවසේ දෙර ජනේල වසයි ද මෙසේ අනුන් වඤ්චා කරන්නා වසලයෙක් යැයි දත යුතු ය.

**යො වෙ කිඤ්චික්ඛ කම්‍යතා - පන්‍ථස්මිං වජතං ජනං,**
**හන්‍ත්‍වා කිඤ්චික්ඛ'මාදෙති - තං ජඤ්ඤා වසලො ඉති.**

11. "**කිඤ්චික්ඛකම්‍යතා**" යමෙක් ඉතා ස්වල්ප වූ දෙයක් කැමති ව හෝ "**පන්‍ථස්මිං වජතං ජනං**" මාර්ගයෙහි රථවාහන කරත්ත ආදියකින් හෝ පා ගමනින් හෝ යන එන ස්ත්‍රී පුරුෂාදී ජනයා "**හන්‍ත්‍වා කිඤ්චික්ඛං මාදෙති**" මරා හෝ තලා පෙලා හෝ ඔවුන්ට කිසිවක් නො තබා ඔවුන් සතු දේ පැහැර ගන්නේ ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො අත්තහෙතු පරහෙතු - ධන හෙතු ච යො නරො,**
**සක්ඛිපුට්ඨො මුසාබ්‍රෑති - තං ජඤ්ඤා වසලො ඉති.**

12. "**අත්තහෙතු**" යමෙක් තමාගේ ජීවිත හේතුවෙන් හෝ "**පරහෙතු**" අනුන්ගේ ජීවිත හේතුවෙන් හෝ ධනහෙතු තමන්ගේ හා අනුන්ගේ ධනය හේතුවෙන් හෝ "**සක්ඛිපුට්ඨො**" නඩුහබ ආදියක් විසඳීම් ආදියෙහි දී "**මුසාබ්‍රෑති**" දත් දෙය නො දත්තෙමි යැයි කියා හෝ නොදත් දෙය දත්තෙමි යැයි කියා හෝ හිමියන් අහිමියන් කොට හෝ අහිමියන් හිමියන් කොට හෝ මෙසේ යමෙක් දූන දූන බොරු කියයි ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො ඤාතීනං සඛානං වා - දාරෙසු පතිදිස්සති,**
**සහසා සම්පියෙන වා - තං ජඤ්ඤා වසලො ඉති.**

13. "**ඤාතීනං වා**" යමෙක් තම මව් පස, පිය පස පරම්පරා ගත ඤාති සම්බන්ධ වූ හෝ "**සඛානං වා**" තම හිතමිතුරන්ගේ හෝ දාරෙසු

භායයීාවන් කෙරෙහි, සහසා වා බලහත්කාරයෙන් හෝ, "**සම්පියෙන වා**" සිය කැමැත්තෙන් හෝ, "**පතිදිස්සති**" පිළිකුල් සහගත ලෙස හැසිරෙයි ද, හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො මාතරං වා පිතරංවා - ජිණ්ණකං ගත යොබ්බනං,**
**පහුසන්තො න භරති - තං ජඤ්ඤා වසලො ඉති.**

14. "**මාතරං වා පිතරං**" වා යමෙක් මෛත්‍රියට ප්‍රධාන අරමුණ වූ මවට හෝ පියාට මෛත්‍රියෙන් උපකාර නොකරයි ද, "**ජිණ්ණකං ගතයොබ්බනං**" ඒ මව්පියන් වියපත් වූ විට හෝ දුබල වූ විට හෝ රෝගාතුර වූ විට හෝ මෙසේ කරුණාවෙන් පිහිට විය යුතු විටෙක දී පිහිට නොවෙයි ද, "**පහු සන්තො න භරති**" ධන සම්පත් හා සියලු පහසුකම් ඇති විට උපකාර නොකරයි ද, හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො මාතරං වා පිතරං වා - භාතරං භගිනිං සසුං,**
**හන්ති රොසෙති වාචාය - තං ජඤ්ඤා වසලො ඉති.**

15. "**මාතරං වා පිතරං වා**" යමෙක් තම මවට හෝ පියාට හෝ "**භාතරං වා භගිනිං වා සසුං වා**" සොහොයුරාට හෝ සොහොයුරියට හෝ නැන්ද, මාමාට හෝ "**හන්ති**" අතින්, පයින් හෝ ගල්, මුල්, මැටි-කැට, කැබලිති ආදී කිසිවකින් හෝ පහර දෙයි, "**රොසෙති**" ඔවුන් කෙරෙහි ක්‍රෝධ උපදවයි ද, "**වාචාය**" පරුෂ වචනයෙන් බැණ වදී ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො අත්ථං පුච්ඡිතො සන්තො - අනත්ථ'මනුසාසති,**
**පටිච්ඡන්නෙන මන්තෙති - තං ජඤ්ඤා වසලො ඉති.**

16. "**අත්ථං පුච්ඡිතො සන්තො**" යමෙක් මෙලොව පරලොව පිළිබඳව යමක් විමසූ විටෙක "**අනත්ථං අනුසාසති**" අනර්ථයක්, අයහපතක් කිරීමට කැමති ව වැරදි දෙයකින් අනුශාසනා කරයි ද, "**පටිච්ඡන්නෙන මන්තෙති**" ඔහුට යහපත් දෙයකින් අනුශාසනා කරන්නේ නමුත් නො තේරෙන ලෙස කියයි ද, අවශ්‍ය දේ නොකියා අනිකකින් අනුශාසනා කරයි ද, ගුරු මුෂ්ටි වශයෙන් තබා

ගෙන බොහෝ කල් ගතකොට ස්වල්පයක් කියා දේ ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො කත්වා පාපකං කම්මං - මා මං ජඤ්ඤාති ඉච්ඡති,**
**යො පටිච්ඡන්නෙන කම්මන්තො - තං ජඤ්ඤා වසලො ඉති.**

17. "**කත්වා පාපකං කම්මං**" යමෙක් සතුන් මැරීම- සොරකම - වැරදි කාම සේවනය යන කාය දුශ්චරිතයන් කොට, බොරු කීම - කේලාම් කීම - පරුෂ වචන කීම - හිස් වචන කීම යන වචී දුශ්චරිතයන් කොට, අභිද්‍යාව නම් විෂම ලෝභය - ව්‍යාපාද නම් ක්‍රෝධය - මිථ්‍යාදෘෂ්ටිය නම් වැරදි දැක්ම යන මනෝ දුශ්චරිතයන් කොට "**මා මං ජඤ්ඤාති ඉච්ඡති**" මම මෙලෙස පවුකම් කරන්නෙකු බව නො දැනගනිත්වා යැයි කැමති වේද,

18. "**පටිච්ඡන්නෙන කම්මන්තො**" මෙසේ ත්‍රිවිධ ද්වාරයෙන් පවුකම් අනුන්ට නොදැනෙන ලෙස කොට ඒවා රහසක් වශයෙන් තබා ගනී ද මෙම පවුකම් දෙකෙන් යුතු තැනැත්තා වසලයෙකු යැයි දත යුතු ය.

**යො වෙ පරකුලං ගන්ත්වා - භුත්වාන සුචි භොජනං,**
**ආගතං න පටිපූජෙති - තං ජඤ්ඤා වසලො ඉති.**

19. "**පරකුලං ගන්ත්වා**" යමෙක් ඥාතියෙකු ගේ හෝ මිත්‍රයෙකු ගේ හෝ නිවෙසකට ගොස් "**සුචිභොජනං භුත්වාන**" ප්‍රණීත වූ ආහාර පානාදිය අනුභව කොට, "**ආගතං න පටිපූජෙති**" එම ඥාති මිත්‍රාදීහු තම නිවෙසට පැමිණි කල්හි තමන්ට හැකියාව තිබියදීත් ප්‍රණීත වූ ආහාර පානාදියෙන් සංග්‍රහ නො කරයි ද, අවමන් සහිතව දෙයි ද, නැතහොත් කිසිවක් නො දෙයි ද හෙතෙම වසලයෙකු යැයි දත යුතු ය.

**යො බ්‍රාහ්මණං වා සමණං වා - අඤ්ඤං වාපි වනිබ්බකං,**
**මුසාවාදෙන වඤ්චෙති - තං ජඤ්ඤා වසලො ඉති.**

20. "**බ්‍රාහ්මණං වා**" යමෙක් පවු බැහැර කළ රහතන් වහන්සේ නමකට හෝ, "**සමණං වා**" සසර ගමන අවසන් කළා වූ හෝ පාපයන් නැසුවා වූ , ආයර්‍ය වූ ද අනායර්‍ය වූ ද සිල්වත් ගුණවත් උතුමන්ට හට "**අඤ්ඤං වා අපි වනිබ්බකං**" දුගී මගී යාචකාදීන්ට හෝ "**මුසාවාදෙන වඤ්චෙති**" ස්වාමීනි! අවශ්‍ය වූ යමක් ඇති විට මට කියනු මැනවි හෝ අසවල් දේ නම් මට පිදිය හැක, අවශ්‍ය වූ විටෙක කියනු මැනවි කියා පැවරීම කොට ඉල්ලූ විට නො දෙයි ද, අසවල් ප්‍රමාණයක් දෙමි යැයි කියා ස්වල්පයක් දෙයි ද, මෙසේ මුලදී කැමති කරවා ගෙන පසුව මුලා කරයි ද හෙතෙම වසලයෙක් යැයි දත යුතුය.

**"යො බ්‍රාහ්මණං වා සමණං වා - භත්තකාලෙ උපට්ඨිතෙ,**
**රොසෙති වාචා නචදෙති - තං ජඤ්ඤා වසලො ඉති."**

21. යමෙක් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙක් හෝ අන් යාචකයෙක් හෝ මගියෙක් හෝ ආගන්තුකයෙක් හෝ "**භත්තකාලෙ උපට්ඨිතෙ**" ආහාර අනුභව කරන විටෙක දී පැමිණියේ වේද, "**රොසෙතිවාචා**" මේ පින්වත්හු මට අනුග්‍රහයෙන් පැමිණියේ වනැයි නො සිතා නො ගැළපෙන රළු (පරුෂ) වචනයෙන් බැණ වදී ද, "**නචදෙති**" ආහාර පාන හෝ සහල් ආදී අමුද්‍රව්‍ය හෝ කිසිවක් නො දෙයි ද, යහපත් වචන මාත්‍රයකින් සංග්‍රහ කිරීමක් හෝ නොකරයි ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**අසතං යො'ධ පබ්‍රෑති - මොහෙන පළිගුණ්ඨිතො,**
**කිඤ්චික්ඛං නිජිගිංසානො - තඤ්ජඤ්ඤා වසලො ඉති.**

22. "**යො ඉධ මොහෙන පළිගුණ්ඨිතො**" යමෙක් මේ ලෝකයෙහි මෝහයෙන් මුලා වී අන්‍යයන් රවටා **කිසිවක්** ලබාගනු කැමති ව "**අසතං**" "**මේ මේ දේවල් ඔබට වන්නේ ය**" යැයි කියා නිමිති ශාස්ත්‍ර කීමාදිය කරයි ද, "**පබ්‍රෑති**" "**අසවල් ගමෙහි මා සතු වූ මෙබඳු ගෘහ සම්පත් වෙති. එහි යමු, නුඹ මගේ ගෘහණිය වන්නේ ය**" යැයි

**කියා හෝ අන්සතු භායර්‍යාවක් හෝ තරුණියක් හෝ දසියක් හෝ රවටා කථා කරයි ද, "කිඤ්චික්ඛං නිජිගිංසානො"** මෙසේ ඒවා බලාපොරොත්තු වන අය කැඳවාගෙන ගොස් වඤ්චා කොට කිසිවක් ගෙන පලා යනු කැමති වේ ද හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යොචත්තානං සමුක්කංසෙ - පරඤ්ච'මවජානති,**
**නිහීනො හීනමානෙන - තං ජඤ්ඤා වසලො ඉති.**

23. "**චත්තානං සමුක්කංසෙ**" යමෙක් පූර්ව කර්ම හේතුවෙන් පහත් කුලයක ඉපිද, එයින් හීන මානයෙන් යුක්ත වූයේ, "**පරඤ්ච මවජානති**" අන් උසස් කුලවල උපන්නවුන් කෙරෙහි පහත් කොට සැලකීම, කථා කිරීමාදිය කරයි ද,

24. "**නිහීනො හීනමානෙන**" එසේම පහත් කුලයක උපන්නා වූ තමන් උසස් කුලවතෙකු වශයෙන් පෙනී සිටී ද හෙතෙම ද, වසලයෙක් යැයි දත යුතු ය.

**රොසකො කදරියො ච - පාපිච්ඡො මච්ඡරී සඨො,**
**අහිරිකො අනොත්තාපි - තං ජඤ්ඤා වසලො ඉති.**

25. "**රොසකො**" යමෙක් ක්‍රෝධයෙන් යුතුව කයෙන් වචනයෙන් අන්‍යයන්ට පීඩා කරන්නේ වේද,

26. "**කදරියො**" යමෙක් දැඩි මසුරෙක් වූයේ අන්‍යයන් දන් දීමාදී පින්කම් කරනු දැක ඒවා වළක්වයි ද,

27. "**පාපිච්ඡො**" යමෙකුට තමාගේ නැති ගුණ දක්වීමේ ආශාවක් වේද, නැති ගුණ දක්වා ගිහියන් පහදවා ප්‍රත්‍ය ලබාගැනීමේ ආශාවක් වේද මෙය පාපිච්ඡතාව නම් වේ.

28. "**මච්ඡරී**" තම සම්පත් අන්‍යයන්ට නො දෙයි ද, අන්‍යයන් තම සම්පත් පරිභෝග කරනවාට අකැමැති වේද මසුරු කම යැයි කියනු ලැබේ. මෙය පස් වැදෑරුම් වේ.

❖ ආවාස මච්ඡරිය යම් භික්‍ෂුවක් තම ආවාසයට අන් සිල්වත් භික්‍ෂුවක් පැමිණෙනවාට අකමැති වේද, පැමිණි කල්හි ඉක්මනින් පිටව යාම බලාපොරොත්තු වේද, මෙසේ තම සම්පත් අන්‍යයන් පරිභෝග කරනවාට ඇති අකැමැත්ත ආවාස මච්ඡරිය නම් වේ. එහෙත් දුස්සීල කලහකාරාදීන් පැමිණෙනවාට ඇති අකැමැත්ත මේ ආවාස මච්ඡරිය නොවේ.

❖ කුල මච්ඡරිය තමන්ට සිවුපසයෙන් සංග්‍රහ කරන දායක හෝ ඤාති නිවෙස්වලට අන් සිල්වත් භික්ෂූන් පැමිණෙනවාට ඇති අකැමැත්ත කුල මච්ඡරිය නම් වේ. එහෙත් දුස්සීල, කලහකාරාදීන් පැමිණෙනවාට ඇති අකැමැත්ත මේ කුල මච්ඡරිය නොවේ.

❖ ලාභ මච්ඡරිය සිල්වත් ගුණවත් උතුමන්ට ප්‍රණීත ලෙස සිවුපසය ලැබෙනු දැක මෙතෙමේ මේවා නො ලබන්නේ නම් යෙහෙකැයි සිතීම ලාභ මච්ඡරියයි. එහෙත් දුස්සීල කලහකාරාදීන් එසේ ලබනවාට ඇති අකැමැත්ත මේ ලාභ මච්ඡරිය නොවේ.

❖ වර්ණ මච්ඡරිය අසවලා දේහ ලක්‍ෂණයෙන්, රූපයෙන්, පිනෙන්, සීලයෙන්, ධුතාංග ගුණයෙන්, සම්‍යක් ප්‍රතිපදාවෙන්, ආචාර ශීලිතවයෙන් යුක්ත යැයි මෙසේ අනුන්ගේ ගුණ කීම ඇසීමට ඇති අකැමැත්ත වර්‍ණ මච්ඡරිය නම් වේ.

❖ ධම්ම මච්ඡරිය තමන් උගත් ධර්‍ම විනය හා අනෙකුත් ශිල්ප ශාස්ත්‍රාදිය අන්‍යයන්ට නො දෙනු කැමැත්ත හා සම්පූර්ණයෙන් නො දෙනු කැමැත්ත ධර්‍ම මච්ඡරියයි.

29. "**සඨො**" යමෙක් ලාභ සත්කාර ආශාවෙන් තමා තුල නැති ගුණ කියයි ද, හඟවයි ද මෙය සාඨෙය්‍ය නම් වේ. දුශ්ශීල ව සිට සිල්වතෙකු ලෙස පෙනී සිටීම පුහුදුන් ව සිට ආර්‍යයෙකු ලෙස හැඟවීම ආදිය මෙහි ලක්‍ෂණයයි.

30. "**අහිරිකො**" පාපය පිළිකුල් කරන ලක්‍ෂණය වූ ලැජ්ජාව යමෙකුට නැත්තේ වේද, එය අහිරිකය නම් වේ. පාපය උසස් කොට සැලකීම, පවු කිරීම නම්බුකාරකමක් කොට සැලකීමාදිය මෙහි ලක්‍ෂණයයි.

31. **"අනොත්තාපි"** එම අහිරිකය නම් වූ ලැජ්ජාව නැති බැවින් ම කයින් වචනයෙන් පවුකම් කිරීමට බියක් තැතිගැන්මක් යමෙකුට නැත්තේ වේද, මෙය අනොත්තප්පය නම් වේ. යමෙක් මෙම අකුසල ධර්ම සයෙන් යුක්ත වූයේ වේද, හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො බුද්ධං පරිභාසති - අථවා තස්ස සාවකං,**
**පරිබ්බාජං ගහට්ඨං වා - තං ජඤ්ඤා වසලො ඉති.**

32. **"බුද්ධං පරිභාසති"** යමෙක් අවබෝධ කළ යුතු වූ සියලු ධර්ම පරෝපදේශ රහිතව ස්වකීය ඥානයෙන් අවබෝධ කළ සම්මා සම්බුදු රජාණන් වහන්සේට **"ඔබ සියල්ල නො දත්තෙහි ය, සියල්ල අවබෝධ නො කළෙහි ය"** යැයි දෙස් නගයි ද, තස්ස සාවකං පරිභාසති ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ රහතන් වහන්සේ නමකට හෝ අන් මාර්ග ඵල ලාභියෙකුට හෝ අන් අනාර්ය වූ සිල්වතෙකුට, ගුණවතෙකුට හෝ දුස්සීල වාදයෙන් අක්‍රෝෂ පරිභව කරන්නේ ද,

33. **"පරිබ්බාජං ගහට්ඨං වා පරිභාසති"** බුදු සසුනෙන් බැහැර පැවිදි ගිහි අයට හෝ ඔවුන්ගේ කිසි දෙසක් නැතිව බොරුවෙන් චෝදනා අපහාස කරයි ද, හෙතෙම වසලයෙක් යැයි දත යුතු ය.

**යො වෙ අනරහා සන්තො - අරහං පටිජානති,**
**චොරො සබ්‍රහ්මකෙ ලොකෙ - එස ඛො වසලා'ධමො.**
**එතෙ ඛො වසලා වුත්තා - මයා වො යෙ පකාසිතා.**

34. **"අනරහා සන්තො"** යමෙක් කෙලෙස් දුරු නොකොට රහත් බවට පත් නොවී, **"අරහං පටිජානති"** මම රහත් වූයෙමි යැයි කයින් හෝ වචනයෙන් හෝ හඟවයි ද, සිතින් හෝ හැඟවීමට කැමති වෙයි ද, රහත් කෙනෙක් යැයි කියා ලෝකයා විසින් කරන ගෞරව පුද සත්කාරාදිය ඉවසයි ද, **"චොරො"** හෙතෙම සොරෙකි. **"සබ්‍රහ්මකෙ ලොකෙ"** උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් දෙවියන් බ්‍රහ්මයන් මනුෂ්‍යයින් සහිත ලෝකයෙහි සොරෙකි. මේ ලෝකයෙහි ගෙවල් බිඳීම මං පැහැරීමාදී වශයෙන් අන් සතු දේ පැහැර ගන්නෝ වෙත්

ද ඔවුහු සොරු නම් වෙති. මෙහි වනාහි සම්බුද්ධ ශාසනයෙහි බුදුරජාණන් වහන්සේ සතු ආමිස දයාදය වූ සිවුපස ප්‍රත්‍යය ආර්‍ය උතුමන්ට අයත් ය. ඒ ආර්‍ය උතුමන්ගේ නාමය ගුණය තමාට ආරෝපණට කරගෙන එම ආර්‍ය ගුණය සොරා කන බැවින් ද, එම ආර්‍ය උතුමන්ට අයත් ප්‍රත්‍ය කොල්ල කන බැවින් සොරෙක් වේ.

එසේම තථාගතයන් වහන්සේ මේ ලෝකයෙහි මහා සොරු පස් දෙනෙක් විද්‍යමාන වෙත් යැයි වදළ සේක. මහණෙනි මේ ලෝකයෙහි මහා හොරු පස් දෙනෙක් විද්‍යමාන වෙති. කවර පස් දෙනෙක් ද යත්?

මේ ලෝකයෙහි එක් සොරෙකුට මෙබඳු අදහසක් වෙයි. මම කවද නම් සියයකින් හෝ දහසකින් මහත් පිරිවරා ගෙන ගොස් ගම්, නියම්ගම්, නගර, ජනපද නසමින් මිනිසුන් ඝාතනය කරමින්, පෙලමින් හැසිර ධනය වස්තුව රැස් කරන්නෙම් ද" යැයි. හෙතෙම පසු කලෙක සියයකින් හෝ දහසකින් යුත් මහත් පිරිසක් පිරිවරා ගෙන ගොස් ගම් නියම්ගම් නගර රටවල් විනාශ කරමින් මිනිසුන් මරමින් ගෙවල් දොරවල් ගබඩා බිඳිමින් මංකොල්ල කමින් මහත් වූ ධන ධාන්‍ය වස්තුව රැස් කරමින් සැරිසරයි.

I. එසේම මේ සසුනෙහි පැවිදි වූ ඇතැම් පවිටු මහණෙකුට මෙබඳු අදහසක් ඇතිවෙයි. "කවද නම් මම සියයකින් හෝ දහසකින් යුක්ත වූ භික්ෂු පිරිසක් පිරිවරා ගෙන ගම් නියම්ගම් රජදහන්හි සත්කාර ලබමින් ගෞරව ලබමින් වැඳුම් පිදුම් ලබමින් ගිහියන්ගෙන් ද පැවිද්දන්ගෙන් ද චීවර පිණ්ඩපාත හා පරිෂ්කාරාදි ය ලබමින් චාරිකාවෙහි හැසිරෙන්නෙම් ද" කියායි. හෙතෙම පසු කාලයකදී සියයකින් හෝ දහසකින් යුක්ත වූ භික්ෂූහු පිරිවර ඇතිව ගම් නියම්ගම් රජදහන්හි සත්කාර ගෞරව ලබමින් වැඳුම් පිදුම් ලබමින් ගිහියන්ගෙන් ද පැවිද්දන්ගෙන් ද චීවර පිණ්ඩපාතාදිය හා පරිෂ්කාරාදිය ලබමින් චාරිකාවෙහි හැසිරෙයි. මහණෙනි මෙතෙමේ මේ ලෝකයෙහි විද්‍යමාන වන පළමු වන මහ සොරා ය.

II. නැවත ද මහණෙනි, මේ ලෝකයෙහි එක් පාපී භික්ෂුවක් තථාගතයන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය විනය ඉගෙන

එය තමන් සොයා ගත් දෙයක් වශයෙන් දක්වයි. මහණෙනි මෙතෙමේ මේ ලෝකයෙහි විද්‍යමාන වන දෙවන මහ හොරා ය.

III. නැවත ද මහණෙනි, මේ ලෝකයෙහි විද්‍යමාන වන ඇතැම් පාපී භික්ෂුවක් ශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යාව ඇති හාත්පසින් පිරිසිදු වූ රහතන් වහන්සේ නමකට මෛථුන ධර්මාදී වස්තුව දක්වමින් හෝ පාරාජිකාදී ඇවත් දක්වමින් හෝ දුස්සීල වාදයෙන් අභූත ව චෝදනා කරයි, මහණෙනි මෙතෙමේ මේ ලෝකයෙහි විද්‍යමාන වන තුන් වන මහ සොරා ය.

IV. නැවත ද මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පාපී භික්ෂුවක් සංඝ සන්තක නො බෙදිය හැකි ගරු භාණ්ඩ ගිහියන්ගේ ප්‍රයෝජනය සඳහා දෙයි. ඒවා ප්‍රධාන කොටස් පසකට බෙදා ඇත. එනම්:-

- ❖ **ආරාම** = මල් වතු, පලතුරු වතු, උයන් ආදියයි. **ආරාම වස්තු** = ආරාම පිණිස සඟ සතු කර පූජා කරන ලද වගා නොකළ ඉඩම් ය පළමුවැන්න ය.
- ❖ **විහාර** = ප්‍රාසාදදී සේනාසනයෝ ය. **විහාර වස්තු** = විහාර සඳහා පූජා කළ ඉඩම් දෙවැන්න ය.
- ❖ ඇඳ, පුටු, කොට්ට, මෙට්ට, ආදිය තෙවැන්න ය.
- ❖ ලෝහ හැලි, ලෝහ කටාරම්, වෑ, පොරව, නියන්, උදලු, යකඩ ඉනි ආදී ආයුධ භාණ්ඩ සිවුවැන්න ය.
- ❖ ලී බඩු, මැටි බඩු, උණ ගස්, තෘණ වර්‍ග ආදිය පස්වැන්න ය. මෙම ගරු භාණ්ඩ ගිහියන්ගේ ප්‍රයෝජනය සඳහා දෙයි ද මෙතෙමේ මේ ලෝකයෙහි විද්‍යමාන වන සතරවන මහ සොරා ය.

V. නැවත ද මහණෙනි, මේ ලෝකයෙහි යම් පාපී භික්ෂුවක් තමා තුල නැති ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන, සුඤ්ඤතාදී විමෝක්ෂ, සුඤ්ඤත සමාධි ආදී සමාධි, සුඤ්ඤත සමාපත්ති ආදී සමාපත්ති, ත්‍රී විද්‍යා නම් වූ ඥාන දර්‍ශනය, බෝධිපාක්ෂික ධර්‍ම නම් වූ මාර්‍ග භාවනා, සෝතාපත්ති ආදී ඵල ශාක්ෂාත් කළ බව, රාගාදී

ක්ලේශ ප්‍රහාණය කල බව, ප්‍රථම ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලී විසීම, සිත නීවරණයන්ගෙන් තොර බව යන මේ සාමාන්‍ය මනුෂ්‍යයන් තුල නැත්තා වූ, දන සීලාදී සාමාන්‍ය මනුෂ්‍ය ගුණ අබිබවා ගොස් ලැබිය යුතු වූ උත්තරීතර මානුෂීය ගුණ තමා තුල ඇත යැයි කියා ද, ඒ උත්තරි මනුෂ්‍ය ධර්ම ඇති බව හැඟවෙන ලෙසට කථා කරයි ද, හැසිරෙයි ද මෙතෙමේ දෙවියන් සහිත ලෝකයෙහි දෙව් මිනිසුන් අතර විද්‍යමාන වන ප්‍රධාන ම මහ සොරා යැයි කියනු ලැබේ යැයි වදාළ සේක.

මේ සොරු පස් දෙනා අතරින් පළමුවැන්නා රජ සිටු ආදී ජනයා රවටා චීවරා දී ප්‍රත්‍ය සොරකම් කරයි. දෙවැන්නා තථාගතයන් වහන්සේ විසින් දේශනා කළ පර්‍යාප්ති ධර්මය සොරකම් කරයි. තෙවැන්නා අනුන්ගේ බ්‍රහ්මචර්‍යාව සොරකම් කරයි. සතරවැන්නා සඟ සතු දේ සොරකම් කරයි. පස්වැන්නා බුදුරජාණන් වහන්සේ සතු වූ ශ්‍රාවකයන් අයත් වූ ධ්‍යානාදී ආර්‍ය ධනය වන ධර්ම දායාදය ද චීවර පිණ්ඩපාත ආදී ලෞකික ධනය වන ආමිස දායාදය ද ශ්‍රද්ධාදී ගුණ ඇති මිනිසුන්ගේ කුසල සිත ද සොරකම් කරයි. එබැවින් මේ කියන ලද වසලයන් තිස් හතර දෙනා අතර "**සබ්‍රහමකෙ ලොකෙ**" දෙවියන් බ්‍රහ්මයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ලෝකයෙහි මෙතෙමේ, "**වසලා අධමො**" මහත්ම වසලයා බවට පැමිණෙයි "**චොරො**" මහත්ම සොරා බවට පැමිණෙයි යැයි වදාළ සේක. "**එතෙ බො වසලා වුත්තා - මයා යෙ වො පකාසිතා**" "බ්‍රාහ්මණය, මේ කියන ලද පහත් ගති පහත් පුරුදු ඇති යමෙක් වේද, ඒ සියල්ලෝ ම වසලයෝ වෙති යැයි මම කියමි" යැයි වදාළ සේක.

මේ අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ හට වනාහි කෙනෙක් උපතින් ම වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් වේ යැයි දෘෂ්ටියක් විය. භාග්‍යවතුන් වහන්සේ එය එසේ නොවේ යැයි ඔහුගේ එම දෘෂ්ටිය දුරු කරනු පිණිස මෙසේ වදාළසේක.

**"නජච්චා වසලො හොති - නජච්චා හොති බ්‍රාහ්මණො,**
**කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො"**

පරමාර්ථ වශයෙන් වනාහි කෙනෙක් උත්පත්තියෙන් වසලයෙක් නොවේ. උත්පත්තියෙන් කෙනෙක් බ්‍රාහ්මණයෙක් ද නොවේ. කරන කියන පහත් ක්‍රියාවන් කථාවන් හේතුවෙන් ම කෙනෙක් වසලයෙක් වේ. සියලු පවු දුරලමින් නසමින් මනාකොට හික්මීමෙන් ම පිරිසිදු ක්‍රියාවෙන් අපිරිසිදු ක්‍රියා බැහැර කරන්නා ම බ්‍රාහ්මණයෙක් වේය යැයි වදාළ සේක.

එබැවින් බ්‍රාහ්මණය, පහත් ක්‍රියා ඇත්තා වූ තැනැත්තා බ්‍රාහ්මණයෙක් නොවේ. පහත් වැඩ කරන්නා ම වසලයෙක් වේ. උසස් වැඩ කරන්නා ම බ්‍රාහ්මණයෙක් වේ. ඔබ විසින් මෙය මෙසේ දත යුතු යැයි වදාළ සේක. නැවත ද භාග්‍යවතුන් වහන්සේ එම අර්ථය ම නිදර්ශනයකින් සාදනය කරන්නට ඊළඟට ඇති ගාථා තුන වදාළහ.

**"තදමිනාපි විජානාථ - යථා'මෙදං නිදස්සනං,**
**චණ්ඩාලපුත්තො සොපාකො - මාතඞ්ගො ඉති විස්සුතො"**

බ්‍රාහ්මණය, මා විසින් යම් නිදසුනකින් මේ කරුණ දක්වන්නෙම් ද, ඒ කරුණෙන් ද ජාතියෙන් නොව ක්‍රියාවෙන් ම වසලයෙක් වෙන බව දැනගනුව. බ්‍රාහ්මණය, සැඩොල් කුලයෙහි උපන් පුතෙක් තමන්ගේ ආහාරය සඳහා මැරුණු සුනඛයෙකුගේ මස් ලැබ පිසූ බැවින් **සෝපාක** නමින් පහත් වූ ජාතියෙහි උපන්නෙකු ව සිට **"මාතංග පණ්ඩිතයො"** නමින් දඹදිව ප්‍රකට වූයේ ය.

**"සො යසං පරමං පත්තො - මාතඞ්ගො යං සුදුල්ලභං,**
**ආගඤ්ඡුං තස්සුපට්ඨානං - ඛත්තියා බ්‍රාහ්මණා බහූ"**

ඒ මාතංග නම් සැඩොල් කුලයෙහි උපන් පුත්‍ර තෙමේ අද්භූත වූ උතුම් වූ ඉතා විශිෂ්ට වූ යසසට ද, කීර්තියට ද, ප්‍රශංසාවට ද පැමිණියේ ය. උසස් කුලයක උපන්නෙකුට ද ලැබීමට දුර්ලභ ය වූ යසස, කීර්තිය, ප්‍රශංසාව පහත් කුලයක උපන්නෙකුට ලැබීමක් වේද, මෙය අතිශයින් දුර්ලභ ය කාරණයකි. මෙසේ යසසට, කීර්තියට,

ප්‍රශංසාවට පැමිණියා වූ ඒ මාතංග පණ්ඩිතයන්ගේ උපස්ථානයට ක්‍ෂත්‍රිය යෝ ද, බ්‍රාහ්මණයෝ ද අන්‍ය වූ වෛශ්‍ය ශුද්‍රාදීහු ද, දඹදිව් වැසි බොහෝ මනුෂ්‍යයෝ ද පැමිණියහ.

**"සො දෙවයාන'මාරුය්හ - විරජං සො මහාපථං,**
**කාමරාගං විරාජෙත්වා - බ්‍රහ්මලොකූපගො අහු,**
**න නං ජාති නිවාරෙසි - බ්‍රහ්මලොකූ'පපත්තියා"**

මෙසේ ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ ආදී දඹදිව් වැසියන්ගෙන් උපස්ථාන ලැබූ ඒ මාතංග පණ්ඩිත තෙමේ කෙලෙස් දුරු කළ බැවින් "**විරජ**" නම් විය. බුද්ධාදී උතුමන් පිළිපන් මාර්ගය අනුගමනය කළ බැවින් "**මහාපථ**" නම් විය. "**දෙවයානං ආරුය්හ**" දෙව්ලොව බඹලොව යවන්නට සමත් බැවින්, දෙව්ලොවට යන යානයක් බඳු වූ අෂ්ට සමාපත්ති නම් යානයට නැගී "**කාමරාගං විරාජෙත්වා**" කාම රාගය දුරු කොට මරණින් මතු "**බ්‍රහ්මලොකූපගො අහු**" උත්පත්ති වශයෙන් බ්‍රහ්ම ලෝකයට ගියේ ය. "**න නං ජාති නිවාරෙසි බ්‍රහ්මලොකූ'පපත්තියා**" ඒ මාතංග පණ්ඩිතයන්ට පහත් කුලයෙහි උපන් බව මරණින් මතු බඹලොව ඉපදීම නො වළක්වන ලද්දේ ය. එය මෙසේ දත යුතු ය.

අතීතයෙහි වනාහි මහා පුරුෂයන් වහන්සේ ඒ ඒ උපායෙන් සත්වයන්ට යහපත කරමින් සසර සැරිසරන අතර එක් ජාතියක දී ඉතා පහත් යැයි සම්මත සැඩොල් කුලයෙහි උපන්නේ වේ. නමින් "**මාතංග**" නම් විය. හෙතෙම මැරුණු සුනඛයන්ගේ මස් ගෙනවිත් පිස අනුභව කළ බැවින් "**සෝපාක**" යැයි නමක් විය. රූපයෙන් අයහපත් විරූප පෙනුමක් ඇත්තේ විය. බරණැස් නගරයෙන් පිටත කුඩා පැලක වාසය කළේ ය. ඇතුළු නගරයෙහි භික්‍ෂාවෙහි හැසිර ජීවත් වෙයි. එක් දිනක් ඒ නුවර සුරා පාන සැණකෙළි දවසක සුරා පානය සඳහා ඝෝෂා කළ කල්හි සුරා ධූර්තයෝ තම පිරිවර ජනයා සමග ක්‍රීඩාවට පටන් ගත්හ. තවද සතළිස් කෝටියක් ධනය ඇති බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි උපන් වයස අවුරුදු පසළොසක් - දහසයක් පමණ වූ දිව්‍ය කන්‍යාවක් මෙන් රූපයෙන් දැකුම් කළු වූ එපමණ වයසැති දැකුම් කළු ප්‍රසාද ජනක වූ කුමාරිකාවන් සමග තමන්ගේ කුල පරපුරට අනුරූප වූ ක්‍රීඩා කරන්නෙමි යි කෑ යුතු බිදිය යුතු කැවිලි ආදී ආහාර පාන ද, වර්ණ ගන්ධ සම්පන්න මල් ආදිය ද, මෙසේ ක්‍රීඩාවට අවශ්‍ය බොහෝ දේ ගැල්වල පටවාගෙන

සුදු ගොනුන් යෙදූ රථයකට නැඟී මහ පිරිවරින් උයන් බිමට යාමට පිටත් වූවා ය. ඇය වනාහි අවලස්සන රූප ද, හස්ත පාදදිය විකල වූවෝ ද දැකීම අවමංගලයක් යැයි එබඳු රූප දැකීමට අකමැති වෙයි. ඒ හේතුවෙන් ඇයට **"දිට්ඨමංගලිකා"** යැයි නමක් ඇතිවිය. ඉන් පසු මුලින් භාවිත කළ නමින් ප්‍රකට නොවී ය.

වයස සොළොසක් පමණැති වූ ඒ මාතංග තෙමේ එදින කල් ඇතිව නැගිට රෙදි කඩමල්ලක් හැඳ රන් කයිතාළම අතෙහි බැඳ එක් අතකින් එය හඬවමින් එක් අතකින් ආහාර භාජනය ගෙන, මම මාතංග නම් සැඩොලා වෙමි යැයි කියා හමුවන ජනයාට නමස්කාර කරමින් ආහාර පිණිස නගරය දෙසට පිවිසියේ ය. දිට්ඨමංගලිකාව අවලස්සන රූප දැකීමට අකැමැති බැවින් මිනිස්සු ඇය පැමිණෙන ඉදිරි මාර්ගයෙහි හමුවන පහත් ජනයා ඉවත් කරමින් ගියහ. ඉන් පසු නුවර දෙරටුව දෙසට අතුරු මාර්ගයකින් මාතංග තෙමේ පැමිණියේ ය. දිට්ඨමංගලිකාව ඔහු දැක මේ කවරෙක් දැයි ඇසුවා ය. මහා පුරුෂයන් වහන්සේ "මම මාතංග නම් සැඩොලා වෙමි" යැයි කීවේය. එවිට දිට්ඨමංගලිකාව "මෙබඳු වූවෙකු දැක ගියවුන්ට කවර නම් යහපතක් වේ දැයි" කියා කය සොලවා පිළිකුල් උපදවා කෙළ ගසා තම සේවිකාවන් අමතා **"ඉක්මනින් ජලය ගෙනෙව, චණ්ඩාලයෙක් දක්නා ලද්දෙමි. ඇස් ද මුහුණ ද සෝදන්නෙමි"** යැයි කියා ඇස් ද මුහුණ, කට ද සෝද ගෙන ක්‍රීඩා පිණිස යන ගමන නවත්වා තම පිරිවර ද ගෙන ආ සියලු දේ ද රැගෙන ආපසු තම මාලිගයට ම ගියා ය. මිනිස්සු එය අසා **"අපි උයනට ගොස් ක්‍රීඩා කොට දිට්ඨමංගලිකාව ගෙනෙන කැවිලි ආදිය ලබන්නෙමු. මේ මාතංග විසින් ඒවා අපට නැතිකමට අලාභයක් කළේ ය"** යැයි කිපී **"චණ්ඩාලයා අල්ලා ගනිව්"** යැයි කියා කෙස් වැටියෙන් අල්ලාගෙන බිම හොවා ගල් මුල් ආදියෙන් පහර දී මළේ යැයි සිතා පාදයෙන් ගෙන පසකට ඇද දමා සන්නාහයකින් වසා ගියහ.

මහා පුරුෂයන් වහන්සේ පසුව සිහිය ලැබ නැගිට අත් පා පිරිමැඳගෙන මෙසේ සිතුවේ ය. **"කිම, මේ දුක කවරෙකු නිසා උපන්නේ ද"** යැයි සිහි කොට, අන්කිසි හේතුවක් නැත. **"දිට්ඨමංගලිකාව නිසා ම උපන්නේය"** යැයි දැන, මේ කළ පහත් ක්‍රියාවට මම දිට්ඨමංගලිකාව දමනය කර ඇය ලවා මාගේ දෙපතුල් වන්දවා ගන්නෙමි යැයි සිතා, මිනිසුන්ගෙන් "කිම මහත්වරුනි දෙරටුව

සියල්ලන්ට ම පොදු ද, නැතහොත් බමුණන්ට පමණක් කරන ලද්දක් ද?" යැයි ඇසුවේ ය. සියල්ලන්ට ම පොදු යැයි ඔවුහු කීහ. මෙසේ සියල්ලන්ට ම අයිති දෙරටුවෙන් පිවිස සිඟා ගත් ආහාරයෙන් යැපෙන්නා වූ මා **"දිට්ඨමංගලිකාවගේ පිරිවර ජනයා විසින් මේ අසාධාරණ විපත්තියට පැමිණවූහ"** යැයි වීදියෙන් වීදියට යමින් ජනයාට කියා ඇවිද දිට්ඨමංගලිකාවගේ පියා වාසය කරන මාලිගයෙහි දෙරටුව සමීපයට ගොස් "දිට්ඨමංගලිකාව ලැබෙන්නෙ නම් නැගිටිමි. නො ලැබෙන්නේ නම් නො නැගිටිමි, මෙහි ම මැරෙමි" යැයි කියා බිම මුනින් වැතිර සිටියේ ය.

එම සිට තෙමේ තම ගෙයි දෙරකඩ මාතංග හොත්තේ ය යැයි අසා සේවකයන් යවා කාරණය විමසවා මස්සක් හා ශරීරයෙහි ගා ගැනීමට තෙල් ද දෙවූයේ ය. මාතංග තෙමේ "මම කහවනු පාදයක් පිණිස වැතිරුනෙම් නොවෙමි" කියා ප්‍රතික්ෂේප කළේ ය. ඉක්බිති බමුණා දිට්ඨමංගලිකාවගෙ වරද කුමක් ද? ඇයගේ කිසි දෙසක් වශයෙන් මෙය නොදකුව' යැයි කීයේය. එවිට **"කිසි වරදක් නැති මම දිට්ඨමංගලිකාවගේ පිරිවර ජනයා විසින් ව්‍යසනයට පැමිණවූහ. එබැවින් දිට්ඨමංගලිකා ලැබුනොත් නැගිටිමි, නො ලැබුනහොත් නොනැගිටිමි"** යැයි කීයේය. ඉක්බිති සේවකයෝ ගොස් සිටුවරයාට මෙය කීවේය. සිට තෙමේ තම දුවගේ වරද යැයි දැන, මෙයින් එකකින් කැවුම් කව, එකකින් තෙල් ගෙන ගාගනුව' යැයි මසු දෙකක් යැවුවේ ය. මාතංග පෙර සේම කීයේය. මෙම ක්‍රමයෙන් මසු දෙකක්, හතරක්, කහවණුවක් යවා ද ඔහු නො නැගිටවිය හැකි විය. නැවත ද අගය දෙගුණ වශයෙන් වැඩි කොට කහවනු සියක් දක්වා යැවූ නමුත් ඔහු නැගිටුවන්නට නොහැකි විය. මෙසේ සිදුවෙත් ම හිරු බැස ගියේ ය. ඉක්බිති සිටු බිරිඳ ප්‍රාසාදයෙන් බැස මාතංග හොත් තැන තිරවලින් වට කරවා එහි පැමිණ මාතංග අමතා **"මාතංග පියාණනි, දිට්ඨමංගලිකාවගේ වැරැද්දට සමා වන්න"** යැයි ඉල්ලුවා ය. එහෙත් මාතංගයන්ගෙන් පිළිතුරක් නොවී ය. මෙසේ සිටු බිරිඳ විසින් කහවනු සිය, දෙසීය ආදී ලෙස ලක්‍ෂය දක්වා දුන් නමුත් ඔහු නැගිටුවාලිය නො හැකි විය. මාතංග තෙමේ **"මම කහවනු නොකැමැති වෙමි, දිට්ඨමංගලිකාව ම කැමති වෙමි"** යැයි කීයේය. මෙසේ දින පසක් ගෙවුණේ ය. එකල්හි බොහෝ පඬුරු දී වුව ද දිට්ඨමංගලිකාව ලබාගැනීමට නොහැකි වූ ක්‍ෂත්‍රිය කුමාරාදීහු මාතංගට ඇසෙන දුර සිට

"පුරුෂයෝ නම් නොයෙක් අවුරුදු ගණන් හෝ වීයඝී කොට ප්‍රාථිනා කරන අථියට පැමිණෙති. එබැවින් නුඹ නො කලකිරෙව. ඒකාන්තයෙන් තව දින දෙක තුනක දී දිට්ඨමංගලිකාව ලැබිය හැකිය" යැයි කීහ. මාතංග නිහඬව ම සිටියේ ය. ඉක්බිති සත් වැනි දවසෙහි අවට අසල්වාසීහු නැගී සිටියහ. "**තෙපි මාතංග හෝ නැගිටුවව්, එසේ නැතහොත් දූරිය හෝ මාතංගට දෙව් අප සැම නො නසව්**" යැයි කීහ. ඔවුන්ගේ වනාහි "**යමෙකුගේ ගේ දෙරටුවෙහි මෙසේ හොත් තැනැත්තා මැරෙයි ද, ඔහුගේ ගෙය සමග හාත්පස සත සත බැගින් ගෘහ වාසීහු සැඩොල්හු වෙති**" යැයි මෙබඳු දෘෂ්ටියක් විය. මෙම සිටුවරයාට වෙනත් පුතෙක් හෝ දුවක් නොවී ය. එබැවින් ඔවුන්ගේ මහත් වූ ධන සම්පත්තීන්ට එකම හිමිකාරිය වූ දිට්ඨමංගලිකාවට නිල් පැහැති රෙදි කැබැල්ලක් අන්දවා හැඳිවළං ආදිය දී හඬද්දී ම ඔහු වෙතට පමුණුවා "**නැගිටුව, දූරිය කැටුව යව**" යැයි පාවා දුන්හ. එවේලෙහි දිට්ඨමංගලිකාව පසේක හිඳ නැගිටුව' යැයි කීවා ය. සත් දිනක් ම නිරාහාර ව සිටි බැවින් ඔහුට නැඟී සිටීමට අපහසු විය. දිට්ඨමංගලිකාව විසින් ම ඔහු නැගිටුවීය. මහා පුරුෂයන් වහන්සේ හිඳ දිට්ඨමංගලිකාව අමතා "**සොඳුර, අපි මේ ඇතුල් නගරයෙහි වසන්නට නො ලබමු. එව, නගරයෙන් පිටත වූ මාගේ වාසස්ථානය වෙත මා කැඳවාගෙන යව**" යැයි කීවේය. ඇය ද ඔහුගේ අතින් ගෙන සැඩොල් ගමෙහි වූ ඒ පැල්පත වෙත ගියා ය. ගොස් ඔහුගේ ශරීරයෙහි තෙල් ගා උණු දියෙන් නහවා කැඳ පිස දුන්නා ය. මෙම බ්‍රාහ්මණ කන්‍යාව "**මෙතෙමේ ජනයාගේ පිළිකුලට ලක් වූ ඉතා පහත් කුලයක ඉපිද, උසස් කුල වංශයක උපන් මහත් සැප සම්පත් විඳිමින් ජනයා අතර උසස් ගෞරවයට පත් මා නැසුවේ ය**" යැයි කිසිවක් නො සිතා අව්‍යාජ ස්වාමි භක්තියෙන් සත්කාර කළා ය.

මහා පුරුෂයන් වහන්සේ මෙසේ සිතුවේ ය. "**මේ දිට්ඨමංගලිකාව වනාහි උසස් කුලයක උපන් දඹදිව පුරාවට ඉමහත් ගෞරවයට පත් කුල දුවකි. දන් මා ඇය සමග සම්භෝගයක් කළ හොත් එයින් ඇයට අනථියක් විය හැකිය. එසේම ඇයගේ කීර්තිය හා ගෞරවය කෙලෙසීමට පත් වන්නේ ය. එබැවින් මෙතුමිය සියලු රටවැසි ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ දී උසස් කුලවතුන්ගේ ද, අන් දෙව් මිනිසුන්ගේ ද, වන්දනීයත්වයට පූජනීයත්වයට ගෞරවයට පත් කළ යුතුය. එය මා හට කෙසේ කළ හැකි වන්නේ ද?**" යැයි මෙසේ කල්පනා

කරන්නට විය. මෙසේ කල්පනා කරන මහා පුරුෂයන් වහන්සේට මෙබඳු අදහසක් විය. **"මම වනයට ගොස් ඍෂි පැවිද්දෙන් පැවිදි ව අෂ්ට සමාපත්ති, පඤ්ච අභිඥා උපදවාගෙන එම බලයෙන් මිස අන් කිසි විදිහකින් මෙතුමිය ගරු තැන්හි නො තැබිය හැකිය"** යැයි මෙසේ සිතා දිට්ඨමංගලිකාව අමතා **"සොඳුර, දැන් අපට ජීවනෝපායක් සොයාගත යුතුය. එබැවින් මම ආහාරාදී අවශ්‍ය දේවල් සොයන්නට වනයට යමි. එබැවින් මම නැවත පැමිණෙන තෙක් අමුත්තක් නො සිතා අප්‍රමාදී ව වාසය කරනු මැනව"** යැයි කියා අන් අයට ද කථා කොට **"මේ දිට්ඨමංගලිකාවට පමාවක් නොකොට උපකාර කරව්"** යැයි අවවාද කොට සියල්ලන්ගෙන් ම සමුගෙන හිමවතට ගොස් තාපස පැවිද්දෙන් පැවිදි වූයේ ය. පැවිදි වී කසිණ පරිකර්ම කොට කිහිප දවසකින් ම අෂ්ට සමාපත්ති පඤ්චාභිඥා උපදවා ගත්තේ ය. ඉන් පසු මහා පුරුෂයන් වහන්සේ **"දැන් දිට්ඨමංගලිකාවට පිහිටවීමට මා සතු බලයක් ඇත"** යැයි සිතා අහසට පැන නැගී අවුත් නගරද්වාරයෙහි බැස ඒ බව දිට්ඨමංගලිකාවට දන්වා යැවුවේ ය.

ඇය එය අසා **"මාගේ ස්වාමියා මා හැර පැවිදි වූයේ ය, දැන් මට මගේ මව්පිය ඥාති වර්ගයා ද නැත, ස්වාමියා ද නැත"** යැයි අඬමින් ගොස් මාතංග තාපසයන්ගේ පාමුල වැටී **"ඔබ කවර හෙයින් මා අසරණ කළේ ද"** යැයි දුක් අඳෝනා කියන්නට වූවා ය.

මහා පුරුෂයන් වහන්සේ ඇය අමතා **"දිට්ඨමංගලිකාවෙනි! නුඹ දුකට පත් නොවෙව, සියලු දඹදිව වැසියන් ලවා ඔබට සත්කාර කරවන්නෙමි"** යැයි කියා නැවත ද කියන්නේ මෙය අසව, ඔබ නුවරට ගොස් මෙසේ ඝෝෂා කරව. **"මගේ ස්වාමියා මාතංග නොවේ. මාගේ ස්වාමියා මහා බ්‍රහ්මයා ය. හෙතෙම මෙයින් සත් වන දින සඳ විමන පලාගෙන මා සමීපයට පැමිණෙන්නේ ය"** කියා කීවේය. එය අසා දිට්ඨමංගලිකාව **"ස්වාමීනි! මම බ්‍රාහ්මණ මහාසාර දුවණියක් වී මගේ ම පාප කර්ම හේතුවෙන් මෙසේ අසරණ බවකට බැගෑපත් බවකට පැමිණියා වෙමි. එබැවින් මෙසේ කියන්නට නො හැකි වෙමි"** යයි කීවා ය. එවිට මහා පුරුෂයන් වහන්සේ **"නුඹ මාතංගගේ තේජස් නො දන්නෙහි ය"** යැයි කියා ඇයට පිළිගත හැකි වන සේ අහසට පැන නැගී නොයෙක් විදිහේ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා විශ්වාසය ඇති කරවා ඉහත කී ලෙසට බරණැස් නුවර පුරා ඝෝෂා කරන ලෙස ඇයට අන කරවා

තම වාසස්ථානය වූ හිමවතට ම ගියේ ය. දිට්ඨමංගලිකාව ද නුවරට ගොස් වීදියෙන් වීදියට යමින් **"මගේ ස්වාමියා මාතංග නොවේ. මගේ ස්වාමියා මහා බ්‍රහ්මයා ය. හෙතෙම මෙයින් සත් වන දිනය වන පසලොස්වක මැදි පෝය දින රාත්‍රියෙහි හඳ මඬල පලාගෙන මා සමීපයට පැමිණෙන්නේ ය"** යැයි සෝෂා කළා ය.

මේ කථාව ඇසූ ඇතැම්හු දෙස් නඟන්නට වූහ. සිනාසෙන්නට වූහ. **"මැය තම පාප කර්මයෙන් සැඩොල් බවට පැමිණ නැවත කෙසේ නම් මහා බ්‍රහ්මයාට අයිති වන්නේ ද"** යැයි. ඇය උසස් වූ සිතින් බලවත් විශ්වාසයෙන් ම ඒ සත් දවසෙහි ම නුවර සැරිසරමින් ජනයා ඉදිරියෙහි මෙලෙස සෝෂා කරමින් ප්‍රිතිමත්ව ඒ සත් දවස ගත කළා ය. මෙතුමිය මෙසේ නිභීයව කියන්නට විමෙන් ජනයා එය ඇත්තක් යැයි පිළිගෙන මේ කියන දෙය යම් දිනයක සිදු විය හැකිය යැයි සිතා තම තමන්ගේ නිවෙස් ඉදිරියෙහි මණ්ඩප සාද පැන් ආදිය ලංකොට තබා වැඩි වියට පත් දූරියන් සරසා මහා බ්‍රහ්මයා පැමිණි කල්හි බ්‍රහ්මයාට පරිවාර ස්ත්‍රීන් කොට දෙමු' යැයි අහස බල බලා ම හුන්නාහු ය.

මහා පුරුෂයන් වහන්සේ ඒ පසලොස්වක මැදි පොහෝ දිනයෙහි හිමවතෙහි සිට අහසට නැග සඳ විමනට ගොස් එය පලාගෙන බලා සිටින්නවුට පෙනෙන සේ දෙළොස් යොදුන් පමණ ආත්මභාවයක් මවාගෙන මහා බ්‍රහ්ම රූපයෙන් නික්මුණේ ය. මිනිස්සු චන්ද්‍ර මණ්ඩල දෙකක් ඇතිවූහ යැයි සිතූහ. ඉන් පසු අනුක්‍රමයෙන් එන අයුරු දැක "දිට්ඨමංගලිකාව ඇත්තක් ම කීවා ය. මහා බ්‍රහ්මයා ම මේ දිට්ඨමංගලිකාව දමනය කරන්නට මුලදී මාතංග වේශයෙන් ආවේ ය" යැයි විශ්වාසයට පැමිණියේ ය. හෙතෙම මහා ජනයා බලා සිටියදීම දිට්ඨමංගලිකාවගේ වාසස්ථානයට ම බැස්සේ ය. ඇය ද, එකල්හි ලෝහිත ඍතුවට පැමිණ සිටි බැවින් ඔහු ඒ බව දැන ඇයගේ නාභිය ඇඟිලි අගින් පිරිමැද්දේ ය. ඒ ස්පර්ශයෙන් ඇයට දරු ගැබක් පිහිටියා ය. ඉක්බිති මහා පුරුෂයන් වහන්සේ ඇයට ඒ බව දන්වා පුතෙක් උපන් කල්හි ඔහු නිසා ජීවත් වෙව' යැයි කියා නැවත අහසට පැන නැගී ජනයා බලා සිටියදීම සඳ විමනට ම ගියේ ය.

බ්‍රාහ්මණයෝ "මහා බ්‍රහ්මයාගෙන් අපට දිට්ඨමංගලිකාව ප්‍රජාපතී මාතාවක් වූවා ය" යැයි සත්කාර කරනු කැමති ව ඒ ඒ තැනින්

පැමිණෙන්නට වූහ. ඇයට සත්කාර කරනු කැමති ව පැමිණි ජනයාගෙන් නගර ද්වාරයන්හි ඉඩ මදි වූහ. ඔවුහු දිට්ඨමංගලිකාව රන් රැසක තබා නහවා සරසා රථයකට නංවා මහත් වූ සත්කාරයෙන් නගරය ප්‍රදක්ෂිණා කරවා බරණැස් නගරය මැද මණ්ඩපයක් කරවා එහි ඇය "**මහා බ්‍රහ්මයාගේ ප්‍රජාපතිය**" යැයි දිව්‍යස්ථානයෙහි තබා වාසය කරවති. යම්තාක් ඇයගේ ප්‍රතිරූපය වසන තැනක් කරම් ද, ඒ තාක් මෙහි ම වාසය කෙරේවා' යැයි කීහ. ඇය ඒ මණ්ඩපයෙහි දීම පුතෙකු වැදුවා ය. ජනයා පිරිසිදු දවසක පුතා සමග ඇය නහවා මණ්ඩපයෙහි උපන් බැවින් කුමාරයාට "**මණ්ඩව්‍ය කුමාරයා**" යැයි නම් කළහ. එතැන් පටන් බ්‍රාහ්මණයෝ එම කුමරා "**මහා බ්‍රහ්මයාගේ පුත්‍රයා**" යැයි ඔහු පිරිවරා හැසිරෙති. එතැන් පටන් සිය දහස් ගණන් පුද පඬුරු ගලා එන්නට වූහ. ඒ බ්‍රාහ්මණයෝ කුමාරයාට රැකවල් යෙදූහ. පැමිණියාහු කුඩා කුමාරයා දැක්මට නොලබති. කුමාරයා ක්‍රමයෙන් වැඩීමට පත්ව දන් දීමට පටන් ගත්තේ ය. එහෙත් දුකින් පීඩිත වූවන්ට නොදී බ්‍රාහ්මණයන්ට ම දෙති. මහා පුරුෂයන් වහන්සේ හිමවත සිට" කිම මගේ පුතා දන් දෙයි ද නො දෙයි ද"යි සිහි කොට බලන්නේ බ්‍රාහ්මණයන්ට පමණක් දෙන බව දුටුවේ ය. දැක "**ඔහු යම් සේ සියල්ලන්ට ම දෙයි ද, එසේ කරන්නෙමි**" යි සිතා සිවුරු පොරවා පාත්‍රය ගෙන අහසින් අවුත් තම පුත්‍රයාගේ ගෙයි දොරකඩ සිටියේ ය. කුමාරයා ඔහු දැක, මෙබඳු විරූප වූ සැඩොලෙකු කොහි සිට පැමිණියෙහි ද? වසලයෙක් පැමිණියේ යයි කෝපයට පත් වූයේ මේ ගාථාව කීයේය.

"**කුතො නු ආගච්ඡසි රුම්මවාසී,**
**ඔතලලකො පංසුපිසාචකොව**
**සංකාරචොළං පටිමුච්ච කණ්ඨෙ**
**කො රෙ තුවං හොසි අදක්ඛිණෙය්‍යො**"

"කොහි සිට ඒකාන්තයෙන් එහි ද? පාංශු පිසාචයෙකු වැනි වූ නුඹ වැළැක්විය යුත්තෙකි. බොල බෙල්ලෙහි රෙදි ද්‍රව්‍යයන් මුද ඇති නුඹ කවරෙක් ද? දක්ෂිණාවට නුසුදුස්සෙක් වෙයි" මණ්ඩව්‍ය කුමාරයා මෙසේ කීවේ ය.

එකල්හි බ්‍රාහ්මණයෝ මාතංග තාපසයන් වහන්සේ අල්ලාගෙන අසාධාරණ විපතත්තියට පැමිණවූහ. හෙතෙම අහසින් ගොස් පිටත නගරයෙහි එළඹ සිටියේ ය. මෙම අසත් ක්‍රියාව හේතුවෙන් දෙවියෝ කිපී මණ්ඩව්‍ය කුමාරයා බෙල්ලෙන් ගෙන පා උඩුකුරු කොට,හිස යටිකුරු කොට තැබූහ. හෙතෙම ඇස්වලින් ගලන කඳුළෙන් ද, කටින් නික්මෙන කෙලවලින් ද සුරු සුරු යන අනුකරණයෙන් දුකසේ ප්‍රශ්වාස කරන්නට විය. දිට්ඨමංගලිකාව එය අසා කිසිවෙක් එහි පැමිණ ඇත් දැයි ඇසුවා ය. එසේය, පැවිද්දෙක් පැමිණ ඇත යැයි බ්‍රාහ්මණයෝ කීහ. ඔහු කොහේ ගියේ දැයි ඇය ඇසුවා ය. අහසින් පිටත නගරයට ගියේ යැයි ඔවුහු කීහ. දිට්ඨමංගලිකාව එහි ගොස් මාතංග තාපසයන්ගේ පාමුල වැටී **"ස්වාමීනි, තමාගේ දසයාට සමා වනු මැනව"** යැයි ඉල්ලුවා ය. එසමයෙහි මහා පුරුෂයන් වහන්සේ පිඬු පිණිස හැසිර කැඳක් ලැබ එය වළඳමින් සිටියේ ය. හෙතෙම එයින් ඉතිරි වූ කැඳ ටිකක් දිට්ඨමංගලිකාවට දී **"යව, මෙම කැඳ දිය සැළියක දමා කලතා යමෙකුට භූත විකාර ඇත්නම් ඔවුන්ගේ ඇස්- කන්- නාසා- මුව බිලයන්හි ඉසව ශරීරයට ද ඉසව"** යැයි මෙසේ කිරීමෙන් එම භූත විකාර රහිත වූවෝ වන්නාහ' යි කීවේ ය. ඇය ද එසේ කළා ය. එයින් කුමාරයා ප්‍රකෘතිමත් වූයේ ය. ඉන් පසු දිට්ඨමංගලිකාව මණ්ඩව්‍ය කුමාරයා හට **"දරුව එන්න, පණ්ඩිතයන් වහන්සේ සමා කරවා ගන්නෙමු"** යැයි පුත්‍රයා ද, බ්‍රාහ්මණයන් ද මාතංග තාපසයන් වහන්සේ වෙත ගොස් ඔහුගේ පාමුල මුනින් හොවා ක්ෂමා කරවිය. තාපසයන් වහන්සේ ඔවුන් අමතා භේදයකින් තොරව සියලු ජනයාට ම දන් දිය යුතු යැයි ධර්ම කථාවක් කොට අහසට නැගී හිමවතට ම ගොස් මෙසේ සිතුවේ ය.

ස්ත්‍රීන් අතර ප්‍රසිද්ධියට පත් දිට්ඨමංගලිකාව දමනය කළෙමි. පුරුෂයන් අතර ප්‍රසිද්ධියට පත් මණ්ඩව්‍ය කුමාරයා ද දමනය කළෙමි. දැන් වනාහි කවරෙකු දමනය කළ යුත්තේ' යැයි බලන්නේ බන්දුමතී නගරය අසල බන්දුමතී නදී තීරයෙහි වසන ජාතිමත් තාපසයා දිටී ය. හෙතෙම වනාහි **"මම ජාතියෙන් උසස් වෙමි' යැයි එබැවින් අන්‍යයන් පරිභෝග කළ ජලය පරිභෝග නො කරමි"** යැයි නදී තීරයෙහි ඉහළ කොටසෙහි වාසය කරයි. මහා පුරුෂ තෙමේ ද එහි ගොස් එම තාපසයාගේ වාසස්ථානයට ඉහළ කොටසෙහි වාසයට ගොස් ඒ තාපසයාගේ ජලය පරිභෝග කරන වේලාවෙහි දැහැටි වළඳ එය ජලයට

දැම්මේ ය. තාපසයා ජලයෙහි පාවී ආ දැහැට්ට දැක මෙය කවුරුන් විසින් දමන ලද්දේ දැයි බැලීමට නදියෙහි ඉහළට ගොස් මහා පුරුෂයන් වහන්සේ දැක මෙහි කවරෙක් දැයි ඇසුවේ ය. "**ගුරුතුමනි, මම මාතංග නම් චණ්ඩාලයා වෙමි**" යි ඔහු කීවේය. එවිට තාපසයා "**චණ්ඩාලය ඉවත් වෙව, නදිය ඉහළ නො වසව**" යැයි කීවේය. මහා පුරුෂ තෙමේ "**යහපත ගුරුතුමනි**" යැයි කියා නදිය පහළ වාසයට ගියේ ය. නැවත ද මහා පුරුෂ තෙමේ දැහැටි වළඳ ජලයට දමා මෙය නදියෙහි ඉහළ බලා යත්වා' යි සිතිය. එය තාපසයා සමීපයට පාවී ගියේ ය. තාපසයා කිපී නදියෙහි පහළට ගොස් මහා පුරුෂයන් වහන්සේට "**චණ්ඩාලය ඉවත් වෙව. නදිය පහළ කොටසෙහි නො වසව, නදියෙහි ඉහළ කොටසෙහි ම වසව**" යැයි කීවේය. මහා පුරුෂ තෙමේ ද යහපති ගුරුතුමනි කියා එසේ කළේ ය.

මහා පුරුෂ තෙමේ නැවත නැවත මෙසේ ම කළේ ය. තාපසයා එයින් කිපීමට පත්ව 'සුයඨියා උදා වන කල්හි නුඹගේ හිස සත් කඩකට පැලේවා' යැයි සාප කෙළ්ය. මහා පුරුෂ තෙමේ යහපති ගුරුතුමනි, මම හිරු උදා වන්නට නොදෙමි' යි කියා සුයඨියා උදා වීම වැළැක්වීය. එබැවින් රාත්‍රිය පහව නොයි. අන්ධකාරය හටගත්තේයැයි බියපත් වූ බන්දුමතී නුවර වාසීහු ඒ ජාතිමත් තාපසයා සමීපයට ගොස් ගුරුතුමනි, අපගේ කිසියම් අයහපතක් දෝෂයක් ඇත්තේද?යි ඇසූහ. ඔවුහු වනාහි මේ තාපසයා රහත් ය යැයි සිතති. හෙතෙම ඔවුන්ට මාතංග තාපසයන්ගේ නදිය ඉහළ වාසය ආදී සිදු වූ සියල්ල කීවේය. ජනයා මහා පුරුෂයන් වහන්සේ වෙත එළඹ ස්වාමීනි සුයඨියා මුදනු මැනවයි ඉල්ලූහ. මහා පුරුෂයන් වහන්සේ ඉදින් තොපගේ රහතන් වහන්සේ ඇවිත් මා සමා කරවන්නේ නම් සුයඨියා මුදමි' යැයි කීය. ජනයා ගොස් තාපසයාට ඒ බව කියා එන්න ස්වාමීනි, මාතංග පණ්ඩිතයන් වහන්සේ කමා කරවනු මැනව යැයි කීහ. එවිට තාපසයා "**තොපගේ කලහ කිරීමේ හේතුව මම නො අසමි මම සැඩොලා ක්‍ෂමා නො කරමි**" යැයි කීයේය. එවිට ජනයා ඔබ අප නසති' යැයි කියා තාපසයා අත් පාවලින් අල්ලාගෙන මහා පුරුෂයන් වහන්සේ වෙත ගෙන ගියහ. මහා පුරුෂයන් වහන්සේ "**ඔබ මාගේ පාමුල කුසින් වැටී සමාව ගන්නේ නම් ඔබට සමාව දෙමි**" යැයි කීවේය. මිනිස්සු එසේ කරන ලෙස ඔහුට කීහ. ඉන් පසු මිනිස්සු "**ඔබ කැමැත්තෙන් නොවඳින්නෙහිය**" යැයි ඔහුගේ අත් පාවලින් අල්ලාගෙන මහා පුරුෂයන් වහන්සේගේ පාමුල වැතිර

වූහ. ඉන් පසු මහා පුරුෂයන් වහන්සේ, මම මොහුට සමාව දෙමි, එසේ වුවත් මොහුට අනුකම්පාවෙන් සූයර්‍යයා නො මුදමි, සූයර්‍යයා උද වන කල්හි මොහුගේ හිස හත් කඩකට පැලෙන්නේ ය' යැයි කීවේ ය. මිනිස්සු 'ස්වාමීනි දැන් කුමක් කළ යුතු ද යැයි ඇසූහ. එවිට මහා පුරුෂයන් වහන්සේ, එසේ නම් මොහු ගෙල පමණ ජලයෙහි ගිල්ලවා මැටි පිඩකින් මොහුගේ හිස වසවු. එවිට හිරු රැස් වැදීමෙන් ඒ මැටිපිඩ සත් කඩකට පැලෙන්නේය. එය පැලුණු කල්හි මොහු අන් තැනකට යේවා' යැයි කීවේ ය. ඉන් පසු මිනිස්සු තාපසයා අල්ලාගෙන ගෙල පමණ ජලයෙහි ගිල්වා මැටි පිඩකින් ඔහුගේ හිස වැසූහ. ඉන් පසු මහා පුරුෂයන් වහන්සේ ගේ ඍධියානුභාවයෙන් සූයර්‍ය උදවේදී එම රැස් පතිත වීමෙන් ඒ මැටිපිඩ සත් කඩකට පැලී ජලයෙහි වැටුණේ ය. තාපසයා බියපත් ව එම ප්‍රදේශය අත්හැර පලා ගියහ. මිනිස්සු එය දැක 'පින්වත්නි, මාතංග පණ්ඩිතයන් වහන්සේගේ ආනුභාවය බලව්, යැයි දැහැටි දඬු දැමීමාදී සියල්ල විස්තර කොට මෙබඳු ශ්‍රමණයෙකු ලොව තවත් නැත යැයි කියා ඔහු කෙරෙහි පැහැදුනහ. එතැන් පටන් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීහු ද අන් ලිහි පැවිදි බොහෝ ජනයා ද මාතංග පණ්ඩිතයන් වහන්සේගේ උපස්ථානයට ගියහ. මහා පුරුෂයන් වහන්සේ ධ්‍යාන සුවයෙන් වැඩ සිට ආයු කෙළවර කය බිඳීමෙන් පසු උත්පත්ති වශයෙන් බ්‍රහ්ම ලෝක වාසයට ගියේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "**තදමිනාපි විජානාථ- යථා'මෙදං නිදස්සනං**" යනුවෙන් ආරම්භ වන ගාථාව හා "**න නං ජාති නිවාරෙසි - බ්‍රහ්මලොකූ'පපත්තියා**" යනුවෙන් නිමවන ගාථාව වදාළ සේක. එයින් :-

බ්‍රාහ්මණය, මා විසින් මේ කරුණ පහද දෙන්නට මා ඉදිරිපත් කල මේ නිදසුනක් වේද, ඒ කරුණ මේ අනුව ජාතියෙන් නොව ක්‍රියාවෙන් ම වසලයෙක් වෙන බව දැනගනුව. බ්‍රාහ්මණය, සැඩොල් කුලයෙහි උපන් පුතෙක් තමන්ගේ ආහාරය සඳහා මැරුණු සුනඛයෙකුගේ මස් ලැබ පිසූ බැවින් "**සෝපාක**" නමින් පහත් වූ ජාතියෙහි උපන්නෙකු ව සිට "**මාතංග පණ්ඩිතයො**" නමින් දඹදිව ප්‍රකට වූයේ ය. හෙතෙම ධ්‍යාන අභිඥා ගුණයෙන් සමෘධිමත් ව සිට මරණින් මතු බ්‍රහ්මලෝකෝත්පත්තියට ගියේ ය. මෙසේ ඔහුට උපන් ජාතිය ධ්‍යාන වැඩීමට ද, බ්‍රහ්ම ලෝක උත්පත්තියට ද බාධකයක් නොවී යයි වදාළසේක. තවද එය සාදනය කිරීමට මෙසේ වදාළ සේක.

"**නජච්චා වසලො හොති කම්මනා වසලො හොති**" යනුවෙන් සැඩොල් ආදී පහත් යැයි සම්මත කුලයක උපන් හේතුවෙන් වසලයෙක් නොවේ. කයෙන් වචනයෙන් කරන කියන පහත් කටයුතු හේතුවෙන් ම වසලයෙකු වේය' යැයි වදාළහ. "**නජච්චා හොති බ්‍රාහ්මණො කම්මනා හොති බ්‍රාහ්මණො**" යමෙක් බ්‍රාහ්මණාදී උසස් කුලයක උපන් හේතුවෙන් ම බ්‍රාහ්මණයෙකු නොවේ. කයෙන් වචනයෙන් කරන කියන යහපත් ක්‍රියාවන් හේතුවෙන් ම බ්‍රාහ්මණයෙකු වේය' යැයි වදාළහ. නැවත එය සාදනය කරන්නට මෙස් වදාළහ.

**"අජ්ඣායකකුලෙ ජාතා - බ්‍රාහ්මණා මන්තබන්ධවා,**
**තෙච පාපෙසු කම්මෙසු - අභිණ්හමුපදිස්සරෙ"**

"**අජ්ඣායකකුලෙ ජාතා, බ්‍රාහ්මණා මන්තබන්ධවා**" වේද මන්ත්‍රාදිය ඉගෙන ගන්නා බ්‍රාහ්මණ කුලයෙහි උපන්නා වූ, වේද මන්ත්‍රාදිය නෑයන් කොටගත් පිළිසරණ කොටගත් ඒ බ්‍රාහ්මණයෝ ද "**තෙච පාපෙසු කම්මෙසු, අභිණ්හමුපදිස්සරෙ**" පර පණ නැසීමාදී පාප කර්මයන්හි නැවත නැවත යෙදෙන්නාහු විශේෂයෙන් දක්නා ලැබෙති.

**"දිට්ඨෙව ධම්මෙ ගාරය්හා - සම්පරායෙ ච දුග්ගතිං**
**න තෙ ජාති නිවාරෙති - දුග්ගච්චා ගරහාය වා"**

ඒ වේදමන්ත්‍රාදිය ඇසුරු කොට නැවත නැවත පාපකර්ම කරන්නාහු මිනිසුන් අතර එයින් ම ප්‍රකට වීමෙන් "**දිට්ඨෙව ධම්මෙ ගාරය්හා**" මෙලොව දී ම මව්පියන් විසින් මොවුහු අපගේ පුත්‍රයෝ නොවෙති දුෂ්ට ව උපන් මොවුහු අපගේ කුල වංශයට නිගරු කලහ' යැයි නෙරපා දමව් යැයි කියති. බ්‍රාහ්මණයෝ ද මොවුහු ගෘහපතියෝ ය, මොවුහු බ්‍රාහ්මණයෝ නොවෙති. මොවුන්ට බ්‍රාහ්මණයන් වෙනුවෙන් ලැබෙන බත් වැටුප් ආදිය පරිභෝගයට නො දෙව්. මොවුන් සමග කථා නො කරව්, මොවුහු වූ පව කාරයන් සමග එක්ව පවුකම් කරන්නාහුය' යැයි ගැරහිය යුත්තෝ වෙති. මෙසේ මෙලොව වශයෙන් ද මොවුන්ගේ පැවතුම් දුගතියක විසීමක් බඳු ය. "**සම්පරායෙ ච දුග්ගතිං**" නරක, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපායන්හි විවිධ වූ වෙනස්කම් ඇති දුක්ඛයන් මොවුන්ට පරලොව දී උරුම වෙති "**න තෙ ජාති ගරහාය වා - දුග්ගච්චා වා නිවාරෙති**" එබැවින් ජාතිය උසස් වූයේ හෝ පහත්

වූයේ හෝ පාපකර්ම හේතුවෙන් මෙලොව දී ගැරහීමට පත්වීම හා පරලොව දී අපා දුකට පත්වීම වැළැක්වීමට සමත් නොවේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ වේදය ඉගෙන ගන්නා කුලයෙහි උපන් බ්‍රාහ්මණයන් කෙරෙහි මෙලොව දීම ගැරහිය යුතු ධර්මාදී වශයෙන් ඔවුන්ගේ විනාශය දක්වා දුගතියට යාමෙන් පරලොව දී ඒ බ්‍රාහ්මණ ජාතියේ අභහවය දක්වන්නේ මෙසේ වදාළසේක. **න ජච්චා හොති බ්‍රාහ්මණො, කම්මනා හොති බ්‍රාහ්මණො** යමෙක් උපන් ජාතිය අනුව බ්‍රාහ්මණයෙක් නොවේ. සිත කය වචනය යන තිදෙරින් කරන්නා වූ යහපත් ක්‍රියාවෙන් ම බ්‍රාහ්මණයෙකු වේය යැයි වදාළහ. මෙසේ මේ අර්ථය දක්වා නැවත මේ දෙයාකාර වූ අර්ථය නිගමනය කරන්නට මෙසේ වදාළසේක.

**"න ජච්චා වසලො හොති - නජච්චා හොති බ්‍රාහ්මණො,**
**කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො"**

පරමාර්ථ වශයෙන් වනාහි කෙනෙක් උත්පත්තියෙන් වසලයෙක් නොවේ. උත්පත්තියෙන් කෙනෙක් බ්‍රාහ්මණයෙකු ද නොවේ. කරන කියන පහත් ක්‍රියාවන් කථාවන් හේතුවෙන් ම කෙනෙක් වසලයෙක් වේ. සියලු පවු දුරලමින් නසමින් මනාකොට හික්මීමෙන් ම පිරිසිදු ක්‍රියාවෙන් අපිරිසිදු ක්‍රියා බැහැර කරන්නා ම බ්‍රාහ්මණයෙක් වේය යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙම දේශනාව වදාළ සේක. අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ දේශනාව ගෞරවයෙන් අසා ඉගෙන ගෙන එය අනුමෝදන් වී ඉමහත් ගෞරවයෙන් මෙසේ ප්‍රශංසා කළේ ය.

**"අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම"** භාග්‍යවත් ගෞතමයන් වහන්ස ඉතා යහපති භාග්‍යවත් ගෞතමයන් වහන්ස ඉතා යහපති යයි ප්‍රශංසා කළේ ය. මෙහි **"අභික්කන්තං"** යන්නෙන් ඉතා කදිමයි, ඉතා ඉෂ්ටයි, ඉතා මනාපයි, ඉතා සුන්දරයි යනුවෙන් අර්ථ සතරක යෙදෙයි. "**අභික්කන්තං භො ගොතම**" යනුවෙන් දෙවතාවක් කීමෙන් "භාග්‍යවත් ගෞතමයන් වහන්සේ ඉතා කදිමයි, භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ ධර්ම දේශනාව ඉතා කදිමයි.

එබැවින් භාග්‍යවත් ගෞතමයන් වහන්සේට මගේ පැහැදීම වේ. භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ ධර්ම දේශනාවට පිවිසීමෙන් මගේ පැහැදීම වේ යැයි කරුණු දෙකක් දෙකක් සඳහා ප්‍රශංසා කරයි.

තවද භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ වචනය ඉතා කදිමයි, ශබ්ද වශයෙන් ගුණය කරා යාමෙන් ඉතා යහපත් ය. ශ්‍රද්ධාව ඉපදීම් වශයෙන් ද, ප්‍රඥාව ඉපදීම් වශයෙන් ද ඉතා යහපත් ය. අර්ථ සහිත බැවින් ද, විවරණ සහිත බැවින් ද ඉතා යහපත් ය. නො ගැඹුරු පද ඇති බැවින් ද ගැඹුරු අර්ථ ඇති බැවින් ද ඉතා යහපත් ය. කනට සුවදයක බැවින් ද, හෘදයාංගම බැවින් ද ඉතා යහපත් ය. තමන් උසස් කොට නො දෙසන බැවින් ද, අනුන් පහත් කොට නො දෙසන බැවින් ද ඉතා යහපත් ය. කරුණාවෙන් සිසිල් වූ ගුණයෙන් යුක්ත බැවින් ද, ප්‍රඥාවෙන් පිරිසිදු වූ බැවින් ද ඉතා යහපත් ය. ඉදිරිය දැකීමෙහි සිත්කලු බැවින් ද, පීඩාවට පත් නොකළ හැකි බැවින් ද ඉතා යහපත් ය. අසනු ලබන කල්හි සුව දෙන බැවින් ද, විමසනු ලබන කල්හි හිත වැඩ සලසන බැවින් ද ඉතා යහපත් ය. යනාර්ථයන්ගෙන් ප්‍රශංසා කිරීම මෙහි අදහසයි. ඉන් පසුව ද උපමා සතරක් දක්වමින් ප්‍රශංසා කළේ ය.

"**සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය**" යන මෙහි "**සෙය්‍යථාපි**" යන්නෙන් උපමා සන්සන්දනයෙන් ගැළපීමට පමුණුවයි. "**නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය**" මුව යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ යම් සේද සද්ධර්මයට පිටු පා අසද්ධර්මයෙහි යෙදී සිටි මා භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කොට ඒ අසද්ධර්මයෙන් නැගිටුවාලූහ' යැයි ප්‍රශංසා කළේ ය.

"**පටිච්ඡන්නං වා විවරෙය්‍ය**" තෘණ පිදුරු ආදියකින් වසා තැබූවක් ඒ වැසුම් හැර පෙන්වන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ පෙර කාශ්‍යප දස බලධාරීන් වහන්සේගේ ශාසන අන්තර්ධානයෙහි පටන් මිත්‍යාදෘෂ්ටි ග්‍රහණයෙන් වැසී ගිය ධර්ම විනය නම් වූ ශාසනය විවෘත කළ සේක' යි ප්‍රශංසා කළේ ය.

"**මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය**" යම් සේ දිශාවන් සොයාගත නොහැකි ලෙස මාර්ගය වැරදී මුළා වූවෙකුට මාර්ගය කියා දී උපකාර කරන්නේ යම් සේද, එසේම වැරදි මාර්ගයට මිථ්‍යා මාර්ගයට

බැස සිටි මට භාග්‍යවතුන් වහන්සේ සුගතියට නිවනට යන මාර්‍ගය කියා දුන් සේක' යි ප්‍රශංසා කළේ ය.

**"අන්‍ධකාරෙ වා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති"** ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් ධරන්නේ යම් සේද, එසේම භාග්‍යවතුන් වහන්සේ මෝහාන්ධකාරයෙහි මුලා වී බුද්ධාදී රත්න ස්වරූපයන් නො දැක සිටියා වූ මට ඒ මෝහාන්ධකාරය නසන ධර්‍ම දේශනාව නමැති ප්‍රදීපය දැරීමෙන් මගේ නුවණැස පාදන ලද්දේ ය' යැයි ප්‍රශංසා කළේ ය.

**"අන්‍ධකාරෙ"** මෙහි අන්ධකාරය යන්නෙන් චතුරාංග සමන්වාගත අන්ධකාරය අදහස් කරන ලද්දේ ය. එය වනාහි අව පක්‍ෂයෙහි අමාවක පෝය දිනයක් විය යුතුය. එදින ම මධ්‍යම රාත්‍රියක් ම විය යුතුය. මහා ඝන වනාන්තරයක් මධ්‍යයෙහි ම විය යුතුය. එම මධ්‍යම රාත්‍රිය ඝන වූ කළු වැහි වලාකුළින් වැසී තිබිය යුතුය. එවිට පියවි ඇසට යමක ඡායා මාත්‍රයකුදු නො දැකිය හැකි එම රාත්‍රිය අතිශයින් ම ඝන අඳුරක් ම වේ. මෙය චතුරාංග සමන්වාගත රාත්‍රිය නම් ද වේ.

තවද **"නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය"** යන්නෙන් දුක දැකීමෙන් අසුභයෙහි සුභ' යැයි ගන්නා වරදවා ගැනීම දුරුකිරීම සිදු වේ. මෙය යටිකුරු කර තැබූවක් උඩුකුරු කොට පෙන්වීම හා සමානය.

**"පටිච්ඡන්නං වා විවරෙය්‍ය"** සමුදය දැකීමෙන් දුකෙහි සැපය' යැයි ගන්නා වරදවා ගැනීම දුරුකිරීම සිදු වේ. මෙය වසා තැබූවක් විවෘත කොට පෙන්වීම හා සමානය.

**"මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය"** නිරෝධය දැකීමෙන් අනිත්‍යයෙහි නිත්‍ය' යැයි ගන්නා වරදවා ගැනීම දුරුකිරීම සිදු වේ. මෙය මං මුළා වූවෙකුට පාර කියා දීම හා සමානය.

**"අන්‍ධකාරෙ වා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති"** මාර්‍ගය දැකීමෙන් අනාත්මයෙහි ආත්ම' යැයි ගන්නා වරදවා

ගැනීම දුරුකිරීම සිදු වේ. මෙය ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් දැරීම හා සමානය.

"**එවමෙතං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො**" යන මෙයින් "**සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය.....**" යනාදී ලෙස භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් ධර්මය දේශනා කළ සේක' යැයි ප්‍රශංසා කළේ ය. ඒ ධර්මය ඇසූ හේතුවෙන් මාගේ ශ්‍රද්ධාව දියුණු වීමෙන් තපස ද, කය වචනය සංවර වීමෙන් සීලය ද, හේතුඵල නුවණ ඇතිවීමෙන් ප්‍රඥාව ද, මනසෙහි අකුසල ධර්ම හට ගැනීමට ඇති බිය නම් වූ හිරියෙන් සමාධිය ද, සියලු දුක් නිවා ගැනීමට පිහිටා ගත් යෝගක්ෂේම නම් වූ නිවන ඉදිරියට පමුණුවන වීර්යයෙන් නිරෝධය ද' යැයි යන ලෙස ආර්ය මාර්ගය හා නිරෝධය ප්‍රකාශ කරන ලද්දේ ය. එයින් මාර්ගය සමුදයට ප්‍රතිපක්ෂය. නිරෝධය දුකට ප්‍රතිපක්ෂය. මෙසේ චතුරාර්ය සත්‍යය නොයෙක් ක්‍රමයෙන් දේශනා කළ සේක' යැයි ප්‍රශංසා කළේ ය.

"**එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච**" මෙසේ නොයෙක් ක්‍රමයෙන් චතුරාර්ය සත්‍ය ප්‍රකට කරමින් වදළ ධර්මය මම පිළිගනිමි. ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. නව ලෝකෝත්තර ධර්මය සරණ යමි. අෂ්ටාර්ය පුද්ගල සංඝරත්නය සරණ යමි' යැයි ප්‍රතිඥා කළේ ය.

බුද්ධ ධම්ම සංඝ යන ශ්‍රේෂ්ඨ රත්නත්‍රය තමාට ඇති එකම පිහිටය' යැයි අදහා ගත්තවුන් පිළිබඳව මෙලොව පරලොව දෙකෙහි වන්නා වූ බිය, තැති ගැනීම, අවැඩ, රෝග භය, අපා භය, වධ, බන්ධන නසාලන්නේය' යථාර්ථයෙන් සරණ නම් වේ. බුද්ධාදී රත්නත්‍රයම සත්වයන් හිත වැඩෙහි යොදන්නේ ය. අහිතයෙන් ගලවාලන්නේ ය. සියලු බිය නසන්නේ ය. සසර දුකින් මුදලන්නේ ය. රැකවරණය දෙන්නේ ය. ස්වල්ප වූ ද සත්කාරය මහත් ඵල කරන්නේ ය.

රත්නත්‍රය කෙරෙහි සිත පහදවාගෙන ගෞරව කොට පිළිගැනීමෙන් නැසූ කෙලෙස් ඇති පිරිසිදු සිතින් රත්නත්‍රය මට ඇති එකම පිහිටය' යැයි ශ්‍රද්ධාව පෙරටුකොට ගත් කර්ම ඵල විශ්වාසය නම් වූ සම්‍යක් දෘෂ්ටිමය වූ චේතනාව "**සරණගමනය**" නම් වේ.

මේ කියන ලද ශ්‍රද්ධා මූලික සිතින් යුක්තව රත්නත්‍රය මට ඇති එකම පිහිට යැයි අදහා ගෙන රත්නත්‍රය සේවනය කරන්නා, ඒ අනුව පිළිපදින්නා "**සරණගතයා**" නම් වේ. මේ සරණගතයාම "**උපාසකයා**" නමින්ද හඳුන්වනු ලැබේ. මෙම සරණගමනය "**ලෞකික, ලෝකෝත්තර**" වශයෙන් දෙ වැදෑරුම් වේ.

## ☸ ලෝකෝත්තර සරණගමනය

දක්නා ලද ආර්‍ය්‍ය සත්‍යය ඇති ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සෝවාන් ආදී මාර්ග සිත් උපදිනවාත් සමගම සරණගමනය කෙලෙසන ධර්මයන් මුළුමනින් ම විනාශ කොට අරමුණු වශයෙන් නිවන අරමුණු කොට කෘත්‍යය වශයෙන් රත්නත්‍රය විෂය කොට සමෘද්ධියට පැමිණෙන්නේ ය. සියලු දුක්ඛයන්ගේ අවසානය මේ ලෝකෝත්තර සරණ ගැනීමෙහි ආනිශංසය වේ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන ආර්‍ය්‍ය ඵලයෝ මෙහි විපාක ඵලයෝ ය. මේ ලෝකෝත්තර සරණගමනය කිසි ලෙසකින් කිලුටු නොවේ. මෙහි කිසි භේදයක් නැත. මරණයෙන් පසු හෝ අන්‍ය ශාස්තෘවරයෙකු නො අදහන්නේ ම ය. මේ ආර්‍ය්‍ය සරණ ලැබූවකුගෙන් භවාන්තරයෙහිදී හෝ ප්‍රාණඝාතාදී කිසිඳු අකුසලයක් සිදු නොවේ. එසේම තම ජීවිත හානියක් නොකරගනියි. හංසයෙකු ජලයෙන් කිරි වෙන් කොට පානය කරන්නා සේ මේ ආර්‍ය්‍ය පුද්ගලයෙකුට නො දැන හෝ කිසි ලෙසකින් සුරාවක් නො පෙවෙත්මය. කිසි කලක දැන දැන කෙලෙස් සිතකින් සිකපද බිඳීමක් නැත්තේ ම ය. ධර්ම විනය නො දැනීමෙන් ප්‍රඥප්ති වද්‍ය සිකපද බිඳීම විය හැකිය

## ☸ ලෞකික සරණගමනය.

තෙරුවන් ගුණ අරමුණු කොට ප්‍රඥවන්තයාගේ සිත ඒ ගුණ විශේෂයෙහි සැක නුපදවා කෙලෙස් කිලුටු අත්හරිමින් අර්ථ වශයෙන් බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණ ඇදහීම, පිළිගැනීම ලෞකික සරණගමනයයි. ශ්‍රද්ධා මූලික සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටාගෙන දසවිධ පුණ්‍ය ක්‍රියා වස්තූන්ගෙන් දිට්ඨිජුකම්ම නමින් කියවෙන දෘෂ්ටිය ඍජුකර ගැනීම

මේ ලෞකික සරණගමනයයි. මෙය අත්තසන්නීයාතන, තත්පරායන, ශිෂ්‍යභාවෝපගමන, පණිපාත යනුවෙන් සතර වැදෑරුම් වේ.

## ❁ අත්තසන්නීයාතන සරණාගමනය

මාගේ ආත්මභාවය භාග්‍යවතුන් වහන්සේට පරිත්‍යාග කරමි. නව ලෝකෝත්තර ධර්‍මයට ද, අෂ්ටාර්‍ය පුද්ගල සංඝයාට ද මාගේ ආත්මභාවය පරිත්‍යාග කරමි. මාගේ ජීවිතය ද පරිත්‍යාග කරමි. රත්නත්‍රයට මාගේ ආත්මය ද ජීවිතය ද පරිත්‍යාග කරන ලද්දේමය. දිවි කෙළවර කොට ඇති උතුම් ම පිහිට, රැකවරණය රත්නත්‍රය' යැයි ප්‍රතිඥා කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම අත්තසන්නීයාතන සරණාගමනය යි.

## ❁ තත්පරායන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රය පිහිට කොට ඇත්තෙම් වෙමි යැයි ප්‍රතිඥා කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**තත්පරායන සරණාගමනය**" යි.

## ❁ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයට ශිෂ්‍යයෙක් වෙමි. මෙසේ මම ශිෂ්‍යයෙකු කොට දරන සේක්වා යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය**" නම් වේ.

## ❁ පණිපාත සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයට ම වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නෙමි මෙසේ මා දරාගණු මැනව යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීම "**පණිපාත සරණාගමනය**" නම් වේ. මේ පණිපාත සරණාගමනය **ඥාති - භය - ආචාර්‍ය -**

**දක්ෂිණාහී** වශයෙන් සිවු වැදෑරුම් වන්නේ ය. එයින් බුදු රජාණන් වහන්සේ නෑයෙකි යැයි ඥාතිකම සැලකීමෙන් ද, බුදු රජාණන් වහන්සේ රාජ පූජිතය, මහානුභාව ඇත්තේ ය. එබැවින් නො වඳින්නේ නම් අනර්ථයක් විය හැකිය යැයි බිය හේතුවෙන් ද, බුදු රජාණන් වහන්සේ මාගේ ආචාර්‍ය්‍යවරයාය. එබැවින් නො වැඳ සිටීම නුසුදුසු ය යැයි ආචාර්‍ය්‍ය වශයෙන් සැලකීමෙන් ද සරණ නො පිහිටන්නේ ය.

යමෙක් "මෙතෙමේ ම ලොව ආර්‍ය්‍ය භාවයට පැමිණියේ ය. ලොව සියලු සත්වයන්ට උතුම් ය. අග්‍ර **දක්ෂිණාහී**" වේ යැයි වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නේ ද හෙතෙමේට ම "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන්ව ගැනීමෙන් සරණ පිහිටන්නේ ය. මෙසේ සරණ **දක්ෂිණාහී** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් ම පිහිටන්නේ ය. **ඥාති - භය - ආචාර්‍ය්‍ය** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් ම බිඳෙන්නේ ය.

මෙසේ රත්නත්‍රය සරණ ගිය බුද්ධ ශ්‍රාවකයෙකු අන්‍ය තීර්ථකයන් වෙත පැවිදි වූ හෝ ගිහි වූ හෝ තම ඥාතියෙකු වෙත ගොස් ඥාතිකම සලකා වැඳීමෙන් ද, රජතෙමේ රටවැසියන් විසින් වඳිනු පුදනු ලබන්නේ ය. එබැවින් වැඳීම- පිදීම නොකළ හොත් නපුරක් කරන්නට බැරි නැතැයි බිය හේතුවෙන් වැඳීම- පිදීම කිරීමෙන් ද, ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ අන්‍ය තීර්ථකයකුට ගුරු ගෞරවයෙන් වැඳීම- පිදීමාදිය කරන්නාගේ ද සරණ නො බිඳෙන්නේ ය.

මේ "**ලෞකික සරණගමනය**" රත්නත්‍රය පිළිබඳ ගුණ නො දැනීමෙන් ද, ඒ මහත් වූ ගුණයන් පිළිබඳව උපදනා සැකයෙන් ද, රත්නත්‍රය පිළිබඳව වැරදි ආකාරයෙන් දැකීමෙන් ද කිළිටි වන්නේ ය. තවද මේ ලෞකික සරණගමනය "**සාවද්‍ය - අනවද්‍ය**" වශයෙන් දෙ වැදෑරුම් වේ. එයින් "**සාවද්‍ය සරණගමනය**" අන්‍ය ශාස්තෘවරයෙකු අත්තසන්නීයාතන ආදි ලෙස සරණ ගැනීමෙන් බිඳෙන්නේ ය. මෙයින් අනිෂ්ට විපාක ලැබෙන්නේ ය. "**අනවද්‍ය සරණගමනය**" මරණයෙන් බිඳෙන්නේ ය. මෙයින් අන්‍ය ශාස්තෘවරයෙකු සරණ ගැනීමක් නොවන බැවින් අනවද්‍ය සරණාගමනය නම් වේ.

මේ ලෞකික සරණාගමනය අත්තසන්නියාතනාදී, සතරාකාරයෙන් ම හෝ එක් ආකාරයකින් හෝ සරණ ගැනීම පිහිටන්නේ ය. මේ අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ පණිපාත සරණාගමනයෙන් සරණ ගියේ ය.

**"උපාසකං මං භවං ගොතාමා ධාරෙතු අජ්ජතගෙ පාණුපෙතං සරණං ගතං ඉති"** භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිමියෙන් සරණ ගියා වූ උපාසකයෙකු කොට මා දරණ සේක්වා යැයි උපාසක භාවය ප්‍රතිඥා කළේ ය.

මෙහි **"උපාසකං"** යනු දිවි හිමි කොට අන් ශාස්තෘවරයකු හෝ ධර්මයක් හෝ සරණ පිහිට වශයෙන් නො අදහන්නා වූ නො පිළිගන්නා වූ රත්නත්‍රයම සරණ පිහිට කොටගත් තැනැත්තා ය. භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයාගේ ලක්‍ෂණ මේසේ වදාළසේක.

බුද්ධ ශ්‍රාවක වූ උපාසක භාවයට පැමිණියෙකු බුද්ධ රත්නය සරණ ගියේ වේද, ධර්ම රත්නය සරණ ගියේ වේද, සංඝ රත්නය සරණ ගියේ වේද මෙපමණකින් උපාසකයෙකු වේ. ඒ උපාසක තෙමේ සුගති මග , දුගති මග, නිවන් මග මේ මේ යැයි යා යුතු නොයා යුතු මග දැන දුක් කෙළවර කිරීම පිණිස පිළිපන්නෙකු වේ. එබැවින් සත්ව වෙළඳම, ආයුධ වෙළඳම, වස විෂ වෙළඳම, මත් ද්‍රව්‍ය වෙළඳම, වහල් වෙළඳම යන අධර්ම වෙළඳමෙන් වැළකුනෙකු වේ. නිති පන්සිල්, උපෝසථ සිල් සමාදන්ව පුරමින් සමථ විපස්සනා භාවනා වඩමින් සුපිරිසිදු ගුණ ගරුක දිවියක් ගත කරන්නෙක් වේ. යම් දිනක පටන් තෙරුවන් සරණ ගියේ වේද එතැන් පටන් ඒ උපාසක තෙමේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්ත වේද, සීලයෙන් යුක්ත වේද, ත්‍යාගවන්ත වේද, ශ්‍රමණ දර්ශනයට කැමති වේද, ධර්ම ශ්‍රවණයට කැමති වේද, ඇසූ ධර්මය මතකයෙහි තබා ගනී ද, එය නැවත නැවත සිහි කරයි ද, අර්ථ වටහා ගනී ද, එහි ප්‍රතිපත්ති වශයෙන් හැසිරෙයි ද මෙබඳු උපාසක තෙමේ තමාට හිත වැඩ කරගන්නා වූ උපාසකයෙක් වේ. එසේම අන් අය මේ ධර්මයෙහි යොදවයි ද හෙතෙම අනුන්ට හිත වැඩ පිණිස පිළිපන්නෙකු වේ.

මෙහි දී අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ "**උපාසකං මං භවං ගොතාමා ධාරෙතු අජ්ජතගෙ පාණුපෙතං සරණං ගතං**" භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිමියෙන් සරණ ගියා වූ උපාසකයෙකු කොට මා දරණ සේක්වා යැයි ඉහත කී ලෙසින් රත්නත්‍රය සරණ යාමෙන් තමන් හට සිදුවන උසස් ලාභය, පිහිට, රැකවරණය අර්‍ථ වශයෙන් සිහි කොට ඉමහත් සොම්නසකින් යුතුව උපාසක භාවය ප්‍රතිඥා කළේ ය.

# ❄ උපාසකත්වය

උපාසකත්වය පිළිබඳව දීඝ නිකායට්ඨකථා සාමඤ්ඤඵල සූත්‍ර වර්‍ණනාවෙහි මෙසේ සඳහන් වේ.

"**කො උපාසකො ති = යො කොචි සරණගතො ගහට්ඨො**" තෙරුවන් සරණ ගිය ගිහි පින්වතා උපාසක නම් වේ.

"**කස්මා උපාසකො ති = රතනත්තයං උපාසනතො**" කුමක් නිසා උපාසක නම් වේ ද? රත්නත්‍රය කරා එළඹෙන බැවින් ඇසුරු කරන බැවින් උපාසකයා නම් වේ.

"**කිමස්ස සීලන්ති = පඤ්ච වෙරමණියො**" පඤ්ච දුෂ්චරිතයන්ගෙන් වැළකීම ඔහු ගේ සීලය යි.

යමෙක් බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද, එපමණකින් හෙතෙම උපාසකයෙකු වෙයි.

"**කො ආජීවො ති = පඤ්ච මිච්ඡාවණිජ්ජා පහාය ධම්මෙන සමෙන ජීවිතකප්පනං**" සත්ව හිංසනයට යොදා ගන්නා ආයුධ වෙළඳම, දාස බව ආදියට මනුෂ්‍යයන් විකිණීම, සූනබයන් ඇති දැඩි කරන්නා සේ මුව, ඌරු, එළුවන් වැනි සතුන් ඇති කොට මස් පිණිස විකිණීම, මත් ද්‍රව්‍ය වෙළඳම, වස විස වෙළඳම යන අධර්‍ම වෙළඳම්වලින් වැළකී ධර්‍මානුකූල ජීවිත පැවැත්ම ඔහුගේ ආජීවය යි.

**"කා විපත්තී'ති = යා තස්සෙව සීලස්ස ච ආජීවස්ස ච විපත්ති, අයමස්ස විපත්ති"**

යමෙක් සිල් නො රකියි ද, අධර්ම වෙළඳාම් කරයි ද මෙය ඔහු ගේ විපත්තිය හෙවත් පිරිහෙන මඟ වේ. එබඳු තැනැත්තා ගේ ලක්ෂණ මෙසේ දැක්වේ.

යමෙක් ශ්‍රද්ධාව නැත්තේ වේ ද, සිල් බිඳියි ද, කෝතුහල මංගල නම් වූ අසන දකින දේවල් ශුභ අසුභ වශයෙන් පිළිගන්නෙකු වේ ද, කෝතුහල මංගල සළකා කර්ම විපාක පිළි නොගන්නෙක් වේ ද, බුදු සසුනෙන් බැහැර දන් දීමට සුදුස්සන් සොයයි ද මෙම කරුණු පස සීල විපත්තියට හා ආජීව විපත්තියට හේතු වේ. යමෙක් මෙම කරුණු පසෙන් යුක්ත වේ ද හෙතෙම උපාසක චණ්ඩාලයෙකි. මල බැඳුණු යකඩයක් මෙන් උපාසක මලයෙකි. උපාසක හීනයෙකි.

**"කා සම්පත්තී'ති = යා චස්ස සීලසම්පදා චෙව ආජීවසම්පදා ච, සා සම්පත්ති"** යමෙක් මනාව පන්සිල් රකියි ද, පිරිසිදු ආජීවයෙන් යුක්ත වේ ද, මෙය ඔහු ගේ සම්පත්තිය හෙවත් දියුණුවන මඟ වේ. එබඳු යහපත් උපාසකයා ගේ ලක්ෂණ මෙසේ දැක්වේ.

යමෙක් ශ්‍රද්ධාව ඇත්තේ වේ ද, සිල්වත් වේ ද, කෝතුහල මංගලිකයෙක් නොවෙයි ද, කර්ම ඵල විශ්වාස කරන්නෙක් වේ ද, බුදු සසුනෙන් බැහැර දක්ෂිණාර්හයන් නො සොයයි ද හෙතෙම භික්ෂු - භික්ෂුණී - උපාසක - උපාසිකා යන සිවු පිරිසෙහි ප්‍රසාදයට පත්වන බැවින් උපාසක රත්නය නම් වේ. මෛත්‍රිය, කරුණාව, ඉවසීම, ආදී ගුණයන්ගෙන් ද, සීල සුගන්ධය, කීර්ති සුගන්ධය, ගුණ සුගන්ධය ආදියෙන් ද යුත් උපාසක තෙමේ උපාසක පදුමය නම් වේ. සුදු නෙළුම් මලක් සේ මංගල සම්මත අවස්ථාවන්හි දී පෙරමුණෙහි තබා ගන්නා බැවින් ද, සැමට ප්‍රිය මනාප වන බැවින් ද උපාසක පුණ්ඩරීකය නම් වේ.

එබඳු උපාසකයා ගේ ගුණ දසයක් මිලින්ද ප්‍රශ්නයෙහි දක්වා ඇත. ඒවා මෙසේ ය.

1. සඞ්ඝයා හා සමාන සුව දුක් ඇත්තේ ධර්මය අධිපති කොට ඇත්තේ වේ.

2. දන් දීමෙහි ඇලුණේ වේ.

3. සර්වඥ ශාසනයෙහි පිරිහීම දැක එය නගා සිටවීමට උත්සාහ කරන්නෙකු වේ.

4. දුරු කරන ලද කෞතුහල මංගල ඇත්තේ සම්‍යක් දෘෂ්ටිය ඇත්තෙකු වේ.

5. ජීවිත හේතුවෙන් වත් සර්වඥයන් වහන්සේ හැර අනෙකෙකු තම ශාස්තෘවරයා වශයෙන් නො දක්වන්නෙකු වේ.

6. කාය කර්ම වාක් කර්ම ආරක්ෂා කරන්නෙකු වේ.

7. සමගියෙහි ඇලුණෙකු වේ.

8. ඊර්ෂ්‍යා නොකරන්නෙකු වේ.

9. අන්‍යයන් රැවටීමට නොව සත්‍යයෙහි පිහිටා ම සර්වඥ ශාසනයෙහි හැසිරෙන්නෙකු වේ.

10. බුදුන් සරණ ගිය දහම් සරණ ගිය සඟුන් සරණ ගිය කෙනෙකු වේ.

මෙහි "**උපාසක**" යනු දිවි හිමි කොට අන් ශාස්තෘවරයෙකු හෝ ධර්මයක් හෝ සරණ පිහිට වශයෙන් නො අදහන්නා වූ නො පිළිගන්නා වූ රත්නත්‍රයම සරණ පිහිට කොටගත් තැනැත්තා ය. භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයාගේ ලක්ෂණ මේසේ වදාළ සේක.

බුද්ධ ශ්‍රාවක වූ උපාසක භාවයට පැමිණියෙකු බුද්ධ රත්නය සරණ ගියේ වෙයි ද, ධර්ම රත්නය සරණ ගියේ වේ ද, සංඝ රත්නය සරණ ගියේ වේ ද මෙපමණකින් උපාසකයෙකු වේ. ඒ උපාසක තෙමේ සුගති මග, දුගති මග, නිවන් මග මේ මේ යැයි යා යුතු නොයා යුතු මග දැන දුක් කෙළවර කිරීම පිණිස පිළිපන්නෙකු වේ. එබැවින් **සත්ව වෙළඳම, ආයුධ වෙළඳම, වස විෂ වෙළඳම, මත් ද්‍රව්‍ය වෙළඳම, වහල් වෙළඳම** යන අධර්ම වෙළඳමෙන් වැළකුණෙකු වේ. නිති පන්සිල්, උපෝසථ සිල් සමාදන්ව පුරමින් සමථ විපස්සනා භාවනා වඩමින්

සුපිරිසිදු ගුණ ගරුක දිවියක් ගත කරන්නෙකු වේ. යම් දිනක පටන් තෙරුවන් සරණ ගියේ වේ ද, එතැන් පටන් ඒ උපාසක තෙමේ **තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්ත වේ ද, සීලයෙන් යුක්ත වේ ද, ත්‍යාගවන්ත වේ ද, ශ්‍රමණ දර්ශනය කැමති වේ ද, ධර්ම ශ්‍රවණයට කැමති වේ ද, ඇසූ ධර්මය මතකයෙහි තබා ගනී ද, එය නැවත නැවත සිහි කරයි ද, අර්ථ වටහා ගනී ද, එහි ප්‍රතිපත්ති වශයෙන් හැසිරෙයි ද** මෙබඳු උපාසක තෙමේ තමාට හිත වැඩ කරගන්නා වූ උපාසකයෙක් වේ. එසේම අන් අය මේ ධර්මයෙහි යොදවයි ද මෙතෙමේ අනුන්ට හිත වැඩ පිණිස පිළිපන්නෙකු වේ.

භාග්‍යවතුන් වහන්සේ එදින අලුයම මහා කරුණා නුවණින් ලොව බලන කල්හි මේ බ්‍රාහ්මණ තුමාට සිදුවන අර්ථය දැක ඔහුගේ නිවෙස්න වෙත වැඩ මිථ්‍යාවෙන් වෙලී සිටි ඔහුගේ දෝෂ දර්ශනයට ලක් වූයේ ය. එසේ වතු දු තථාගතයන් වහන්සේ ඔහුගේ ම යහපත අභිවෘද්ධිය අපේක්ෂා කොට මෙම අර්ථවත් ධර්ම දේශනාව කොට එම අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා සරණ සිල්හි පිහිටුවා නිර්වාණාවබෝධය දක්වා යන උතුම් මාවතට ඔහු පමුණුවා නැවත ජේතවනාරාමයටම වැඩි සේක.

**"චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං,**
**තස්මිං සගාරවා නිච්චං - හොන්තු සබ්බෙපිපාණිනො"**

මේ උතුම් සද්ධර්මය ලෝකයෙහි පවතීවා. රජු ධාර්මික වෙත්වා. සියලු සත්වයෝ මේ උතුම් ධර්මයෙහි හැසිරෙත්වා.

(මෙය අර්ථකථාචාර්ය ධම්මපාල ආචාර්යයන් වහන්සේගේ ශාසන ප්‍රාර්ථනාවකි )

**සාධු සාධු සාධු**